***2016 ඔක්තෝම්බර් මස 11 වෙනි අඟහරුවාදා දින***
***2016 ஒக்டோபர் மாதம் 11 ஆம் திகதி செவ்வாய்கிழமை***
***Tuesday 11 th October 2016***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------------

සියළු දෙනාටම සුභ උදෑසනක් වේවා! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ගරු අමාත්‍යතුමන්ලා,ගරු සභානායකතුමා ,ඒවගේම විපක්ෂයේ ප්‍රධාන විපක්ෂනායකතුමා ප්‍රමුඛ මේ අවස්ථාවට සහභාගි වෙලා සිටින සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවරුම්:**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ:**

මේ යටතේ කිසිවක් නැහැ.

**ගරු සභාපතිතුමාගේ නිවේදන:**

මේ යටතේ කිසිවක් නැහැ.

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා:**

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක හර්ෂ සියඹලාපිටිය මැතිතුමා. ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා, ආනන්ද මිල්ලන්ගොඩ මන්ත්‍රීතුමා, අකිල එල්ලාවල මන්ත්‍රීතුමා, කරුණාපාල මන්ත්‍රීතුමා,උදයකාන්ත ගුණතිලක මැතිතුමා,නමින්ද අනුරප්‍රිය මන්ත්‍රීතුමා, අතුල හඳගම මන්ත්‍රීතුමා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------------

ස්තුතියි. ගරු සභාවේ නම් ප්‍රකාශ කළ සියළු ගරු මැති ඇමතිතුමන්ලා වෙනුවෙන් සභාවේ නිවාඩු අනුමත කරනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම:**

මේ යටතේ කිසිවක් නැහැ.

**කාරක සභා වාර්තා පිළිගැන්වීම:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පෙත්සම්:**

පෙත්සම් ඉදිරිපත් කිරීම යටතේ අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ පෙත්සම ඉදිරිපත් කිරීමට අවස්ථාව.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි වෙත්තිලකනන්ද, හපුගස්තැන්න,ගොඩකවෙල පදිංචි ඩී.ඩී.දයානි රාජපක්ෂ මිය විසින් ඉදිරිපත් කළ පෙත්සම පිළිගන්වනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ගරු අජිත් කුමර මැද්දෙගම මැතිතුමාට. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනවා.

**ප්‍රශ්න:**

මේ යටතේ කිසිවක් ඉදිරිපත් වී නැහැ.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ :** ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
----------------------------------------------

ගරු සභාපතිතුමනි මම මේ අවස්ථාවේදී ගරු සභාව දැනුවත් කිරීම සඳහා විශේෂයෙන්ම අද දවසේ අපි සබරගමු පළාතේ වැවිලි සමාගම්වල වතු අධිකාරීන් වතු නිවාසවල විවිධ පහසුකම් ලබාදීම සඳහා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘතිය සාකච්ඡා කිරීම සඳහා කැඳවලා තිබෙනවා . ඒ අවස්ථාවේදී විශේෂයෙන්ම ප්‍රධාන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ යෝජනාවක් අනුව අපි මේ කටයුත්ත කරන්නේ. ඒ නිසා අපේ උපදේශක කාරක සභාවේ ගරු සාමාජික මන්ත්‍රීතුමන්ලාට තුමියන්ලාට අපි ලිඛිතව දන්වා ඇති අතර, ගරු සභාවේ පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව මේ වතු අධිකාරීන් සමග මිත්‍රශීලීව ඉදිරි වතුකරයේ සහෝදර ජනතාව වෙනුවෙන් කටයුතු කරන්නට අපි සියළු දෙනාටම පළාත් සභාවේ ඉඩ කඩ ඇති කර ගැනීම සඳහා එතුමන්ලා සමහ මුණ ගැසෙන්න දහවල් පස්වරු 1.00 ට සෙන්චූරියා හෝටලයට එවැනි අවශ්‍යතාවයක් තියෙන ගරු මැති ඇමතිතුමන්ලාට පැමිණෙන්න විශේෂ ආරාධනාවක් කරනවා. ඒ එක්කම අද රත්නපුර දිස්ත්‍රික්කයේ විවිධ විහාරස්ථාන

සහ අනායාගමික , ආගමික සිද්ධස්ථාන වලට ප්‍රධාන අමාත්‍යාංශයෙන් දෙන ආධාර පස්වරු 2.00 ට ස්වාමීන් වහන්සේලා කැඳවලා තියෙනවා. මං හිතනවා ඔක්කෝම ආගමික සිද්ධස්ථාන 152 කට ආසන්න ප්‍රමාණයකට සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ දෙනවා. කෑගලු දිස්ත්‍රික්කයේ 133 කට අපි අනුමත කරලා තියෙනවා. මහ විශාල ප්‍රමාණයක් දෙන අවස්ථාවක් නිසා ඒ කටයුත්තටත් උපදේශක කාරක සභාවෙන් පරිබාහිරව වුවත් අපේ අනිත් මන්ත්‍රීතුමන්ලාට තම තම ප්‍රදේශයෙන් පිටත වුවත් පැමිණ එ අවස්ථාවට පැමිණෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි.

**පෞද්ගලික ප්‍රකාශ කිරීම්:**

***ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල***
***கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல***
*Hon.Member Ranjith Pollgampola*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපි හදිසි අවස්ථාවලදී ප්‍රාදේශීය සභාවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හදිසි අවස්ථාවල ඇස්තමේන්තු සකස් කර ගන්නවා. එවැනි අවස්ථාවල අපිට ඒ ආයතන සහයෝගය ලබා දෙනවා. මේ ගිය සතියේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට ගිහිල්ලා හදිසි අවස්ථාවක ඇස්තමේන්තුවක් සකස් කරලා දෙන්න කියලා කිව්වහම සභාවේ ලේකම්තුමාට. එතුමා කියනවා අපි එහෙම ඉල්ලීම් ලිපියක් දුන්නට ඇස්තමේන්තුවක් සකස් කරලා දෙන්න බෑ කියලා. ඒ සම්බන්ධව අපි අපහසුතාවයට පත් වෙනවා. එතුමා කියන්නේ මේ පළාත් සභාවෙන් දැනුම් දීලා තියෙනවා එවැනි දේවල් කරන්න එපා කියලා. නමුත් අජිත් ශාමින්ද මන්ත්‍රීතුමාටත් එවැනි දෙයක් උදා වුණා කියලා මට ලේකම්තුමා පැවසුවා. එවැනි දෙයක් කරලා තියෙනවාද. මට දැන ගන්න ඕනේ අපිට එහෙම දෙයක් කර ගන්න බැරිද කියලා ප්‍රකාශයක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද අපි සියළුම මන්ත්‍රීවරුන්ට බලපාන ප්‍රශ්නයක් වෙයි ඉදිරියේදී එහෙම වුණොත්.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි රංජිත් පොල්ගම්පොල මන්ත්‍රීතුමනි පළාත් පාලන ප්‍රධාන අමාත්‍යාංශයෙන් තමයි මෙවැනි කටයුතු සඳහා උපදෙස් ලබාදීම් කටයුතු කෙරෙන්නේ. අදාල අමාත්‍යාංශයට යොමු කර ඔබතුමාට ඒ සඳහා පිළිතුරක් ලබාදීමට කටයුතු කරනවා.

***ගරු මන්ත්‍රී අජිත්*** *ශාමින්ද*
***கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த***
*Hon.Member Ajith Shyaminda*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මට පැන නැගී

තිබෙන කාරණාව විශේෂයෙන් පසුගිය සභාවේත් අපි මේ සභාවේ වාද විවාද කරපු සීතාවක ගඟ ආශ්‍රිත මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් පාලම අසල මැණික් නිදිය මැණික් ගැරීම් කටයුතුවල නිරත වෙලා සිටියා පහුගිය කාලයේම දැනට අවුරුදු දෙකක් තිස්සේ මේ වෙන කොට අපි දන්නා තරමින් ඒ මැණික් නිධිය ගොඩ අරන් වෙන්දේසි කරලා අවසාන වෙලා තියෙනවා. නමුත් මේ මැණික් සංස්ථාව ඒ මැණික් නිධිය උපයෝගී කරගෙන ඒ ගඟ හැම තැනම සාමාන්‍ය මද වශයෙන් මැණික් හම්බ වෙන තත්ත්වයක් තියෙනවා. ඒ නිසා ඒ නිධිය විතරක් නෙමෙයි ඒ අවට හැම තැනම භූමියේ හැම තැනම මේ වෙන කොට මැණික් කැනීම් කටයුතු වල නිරත වෙලා ඉන්නවා. මේ පිළිබඳව අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදීත් දැනුවත් කළා. ඕන කෙනෙකුට සීතාවක පාලම උඩින් යද්දී පේනවා අඩි 30 ,40 ක් එක දිගට කණ්ඩිය කඩාගෙන ගිහිල්ලා පාලමටත් අවධානම් තත්ත්වයක් තියෙන්නේ. සීතාවක පාලම කියන්නේ කෑගලු දිස්ත්‍රික්කයටම ප්‍රවේශ වෙන ප්‍රධාන පාලම. දැන් අපිට තියෙන ප්‍රශ්නය ගරු සභාපතිතුමනි පෞද්ගලික අනවසරයෙන් හරි අරන් හරි මේ ඉඩම වෙන්දේසි කරලා ගඟ ඉස්සෙල්ලා දීලා තියෙනවා. ඒ දෙන්නේ ගඟ මැද මැණික් ගැරීම සඳහා. කණ්ඩිය කැඩුණොත් එහෙම වහාම ඒ බලපත්‍රය අහෝසි කරනවා. නමුත් ස්වර්ණාභරණ අධිකාරිය මේකට යොමු වෙලා කරන කොට මේ කිසිම නීතියක් නෑ. අද කණ්ඩි කඩන් ගිහිල්ලා පාලමටත් අවධානම් තත්ත්වයක් තියෙනවා. ඒ නිධියට අඩි 100 ක් 200 ක් දැන් මේ වෙන කොට වට කරගෙන මැණික් කැණීම් කටයුතු කරනවා. දැන් මේක පරිසර අධිකාරියෙනුත් ඇවිල්ලා ප්‍රකාශ කරලා තියෙනවා මේ කණ්ඩියට එහෙම නැත්නම් පාලමට තර්ජනයක් තියෙනවා කියලා. ඒ කෙසේ වෙතත් මේක නවත්තන්නේ නෑ. මේක ගරු සභාපතිතුමනි අපේ ශෝචණීය අවස්ථාවක් අපේ ප්‍රදේශවල ජනතාව කියනවා ඒගොල්ලන්ට නිකන්වත් කූඩයක් අරන් ගඟට බැහැලා මැණික් ගරන්න අවස්ථාවක් කිසිසේත්ම දෙන්නේ නෑ. පොලීසිය සහ එස්ඩීඑෆ් එක පාවිච්චි කරලා කටයුතු කරනවා. මේක ගරු සභාපතිතුමනි ශෝකජනක අවස්ථාවක්. අපේ ප්‍රදේශවල ජනතාව කියනවා ඒගොල්ලන්ට නිකන්වත් ගඟට බැහැලා කූඩයක්වත් අරන් මැණික් ගරන්න අවස්ථාවක් කිසිසේත්ම දෙන්නේ නෑ. පොලීසිය සහ එස්ඩීඑෆ් එක පාවිච්චි කරලා කටයුතු කරනවා. දැන් ගිය මාසයේ පහුගිය කලයේ ඒ ගඟේම කුඩගම කියන ප්‍රදේශයේ අනවසර මැණික් ගැරීම් නවත්තන්න පොලීසිය නෙමෙයි එස්ඩීඑෆ් එක ගිහිල්ලා ඒ යන කොට පීනන්න බැරි කෙනෙක් දියේ ගිලිලා තවත් කෙනෙක් ගිහිල්ලා එයාට බේර ගන්න හදන කොට එස්ඩීඑෆ් එකේ නිළධාරියෙක් කියලා තිබුණා මෙහේට ගේන්න එපා ගහනවා කියලා පොල්ලක් අතේ තියාගෙන. ඒ අවස්ථාවේ ඒ ගිලෙමින් හිටපු මනුස්සයා අත ඇරලා බේර ගන්න ගිය කෙනා පැනලා ගියා. ඒ ළමයා එතනම ගිලිලා මැරුණා. ජීවිතයක අහිමි වුණා. මම දන්නේ නෑ ගරු සභාපතිතුමනි එස්ඩීඑෆ් එකට අයිතියක් තියේද කියලා මේවගේ මැණික් ගැරීම් අල්ලන්න . ඒක අපි දන්න විදිහට මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අවශ්‍ය නම් පොලීසියේ සහයෝගය ඇතිව කරන්න පුළුවන්. නමුත් දැන් අද තමන්ගේ නියමිත රාජකාරියට අමතරව අමතර අයත් මේවාට ඇඟිලි ගහන්න ගිහිල්ලා ලොකු ජීවිත හානි ගණනාවක් ජීවිත හානි සිදු වෙන අවස්ථා දැකලා තියෙනවා. සීතාවක එතන එස්ඩීඑෆ් එකෙන් කෑම්ප් දාගෙන තමයි කරන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි මැණික් සංස්ථාවේ සභාපති ඇතුළු නිළධාරීන් මෙහේට ගෙනල්ලා සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදීත් අපි කිව්වා. නමුත් තඹ සතේකට මේවා ගණන් ගන්නේ නෑ. ඒ නිසා ඔබතුමාගේ අවධානය මම යොමු

කරනවා මේ හැමෝටම එක නීතිය ක්‍රියාත්මක කරන්න දැන් මේ පාලම කැඩන්න ඔන්න මෙන්න එහෙම නැත්නම් තර්ජනයක් පෙනි පෙනී තියෙද්දී දේශපාලඥයෝ පක්ෂ විපක්ෂවත් මේකට විරුද්ධ වෙද්දී මැණික් සංස්ථාවේ සභාපති ඇතුළු ඒ අය ඒගොල්ලන්ට ඕන විදිහට මේ කටයුතු කරනවා. එහෙම නම් පාලම බලන්නේත් නැතුව ගලෝගෙන යන විදිහට ඕන තැනක කපන්න දෙන්න ඕනේ. එහෙම නම් මේ කටයුතු කරන කොට. ඒ නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා අදාල බලධාරීන් දැනුවත් කරලා මේක වහාම නවත්තන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ගරු සභාවට යෝජනා කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ස්තූතියි ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අවශ්‍ය කටයුතු කිරීම සඳහා අදාල රේඛීය අමාත්‍යාංශයටත් ඒවගේම පළාත් අමාත්‍යාංශය තුළත් ඒ කටයුතු කිරීම සඳහා යැවීමට කටයුතු කරනවා. මීළඟට ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

--------------------------------------------------------

ගරු සභාපතිතුමනි අජිත් ශාමින්ද ගරු මන්ත්‍රීතුමා ගෙනාපු ප්‍රශ්නය මටත් ආවා. අපි ඇහැලියගොඩ ඉන්නේ. සීතාවක ප්‍රශ්නය. සීතාවක පාලම කියන්නේ අද සබරගමු පළාත ගත්තහම විශාලම මුදලක් ඒ පාලම කැඩුණොත් වැය වෙන තැනක්. එතන වැලි ගොඩ දාන්න ගන්නවා වගේම අපේ රත්නපුර දිස්ත්‍රික්කය ගත්තහමත් මේවගේ ප්‍රශ්න තියෙනවා ගරු සභාපතිතුමනි. එතකොට පරිසර අමාත්‍ය ධූරය දරන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමා. එතකොට සබරගමු පළාත් සභාවෙන් මේ අකටයුතු නැවැත්වීම සඳහා ඔබතුමා මූලිකත්වය අරගෙන විශේෂයෙන් කටයුතු කළ යුතු යැයි මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි. මොකද හේතුව පරිසරය විනාශ වුණාට පස්සේ අපි කතා කරලා වැඩක් නෑ ගරු සභාපතිතුමනි. එහෙන් ඉවුරු ඛාදනය වෙනවා. මේක එක තැනක නෙමෙයි. වැලි නිදි තියෙන තැන්වල ඒකෙන් අන්ද වෙලා. ඒ මුදලාලිලා. ඒගොල්ලෝ අන්ද වෙලා කරන වැඩෙන් බාල පරම්පරාවට රටක් නැති වෙනවා. පරිසරය විනාශ වෙනවා. එහෙම නම් මේක අතිගරු ජනාධිපතිතුමාත් දැනුවත් කරලා පරිසර අධිකාරියත් දැනුවත් කරලා මේක වහාම නැවැත්වීමට කටයුත්තක් කරන්න කියලා එතුමාගේ යෝජනාවට සම්බන්ධ කරමින් මගේ කතාව අවසන් කරනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ස්තූතියි ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමනි. නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ දෙන්නේ පෞද්ගලික ප්‍රකාශයක් කරන්න. ඒ ප්‍රකාශය හේතු කරගෙන මන්ත්‍රීවරුන් තුන් හතර දෙනෙකුට කතා කරන්න බැහැ. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා පෞද්ගලික ප්‍රකාශයක් කරන්න ඉල්ලලා තිබුණ නිසා අපි එතුමාට දුන්නා. එහෙම නම් ඔබතුමන්ලා කල් තබන අවස්ථාවේ යෝජනාවක් කරලා කතා කරන්න. දැන් පෞද්ගලික ප්‍රකාශයකට ඉඩ දෙන්නේ

තමන්ට පෞද්ගලික ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න. ඒක කරලා අවසන් කළා. ඔබතුමා වෙලාව ඉල්ලුවා නම් ඔබතුමාට කතා කරන්න කියලා අපි වෙලාව දෙනවා. හැබැයි අජිත් මන්ත්‍රීතුමා කතා කළ දේට ඔබතුමාත් කතා කරනවා. තව පොඩ්ඩකින් රත්නායක මන්ත්‍රීතුමා කියයි මටත් ඕක අදාලයි මටත් කතා කරන්න ඕනේ කියලා. ඒක මේ න්‍යාය පත්‍රයේ මේ ස්ථානයට නෙමෙයි අපි ගත යුත්තේ. ඒ නිසා ඔබතුමාට ඉදිරියේදී කතා කරන්න අවශ්‍ය නම් අපිට ඒකට අවස්ථාව දෙන්න පුළුවන්. හැබැයි අපිට පුළුවන් ඒ අවස්ථාව මේකේ න්‍යාය පත්‍රයේ ඒකට කතා කරන්න ස්ථානය නෙමෙයි මේක. ඒක නිසා අපි ඉස්සරහදී කතා කරමු. බොහොම ස්තුතියි. මීළඟට ,

**ශෝක ප්‍රකාශ යෝජනා:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පොදු කටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා:**

මේ යටතේ කිසිවක් ලැබී නැහැ.

**පළාත් සභාවේ පොදු කටයුතු:**

කිසිවක් ලැබී නැහැ.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා අංක 6/1/2016/17 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අපි එතුමාට අවස්ථාව ලබා දෙනවා.

***ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න***
***கௌரவ உறுப்பினர் சலித கருணாரத்ன***
*Hon.Member Salitha Karunaratne*

---

ගරු සභාපතිතුමනි වස විෂ වලින් තොර ආහාර භාවිතය ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම වර්තමානයේ ක්‍රියාත්මක ඉතා යහපත් වැඩ සටහනකි. එම වැඩ සටහන සාර්ථක කර ගැනීමට වෙළඳ පොළ පවතින එළවළු,පලතුරු ඇතුළු ආහාර ද්‍රව්‍ය කල් තබාගැනීමට, ඉදවීම සඳහා කෘතිම රසායනික වැනි අහිතකර දෑ භාවිතා කිරීම වැළැක්වීම හා පාලනය කිරීම කළ යුතුය. ඒ වෙනුවෙන් සබරගමු පළාත තුළ සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් යොදාගෙන ඔවුනට අවශ්‍ය පහසුකම් ලබාදී ක්‍රමවත් වැඩ සටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි මෙම යෝජනාව මම ඉදිරිපත් කරන්නට යෙදුණේ ලැබුණු තොරතුරු දෙකක් නිසා. එකක් තමයි අද

වෙන කොට බෝ නොවන රෝග නිසා මේ රටේ හාරසීයක්, හාරසීය පනහක් පමණ ජනතාවක් මැරෙනවා දිනකට. රටේ පළාත් නවය ගැන බැලුවහම සබරගමු පළාතේ දිනකට පනස් දෙනෙක් මැරෙනවා බෝ නොවෙන රෝග හින්දා. මහා වසංගතයක් ඇවිල්ලා නෙමෙයි. ඉස්සර කාලේය කොළරාව,මැලේරියාව වගේ වසංගත නිසානේ මිනිස්සු මැරෙන්නේ. අද බෝ නොවන රෝග හින්දා ,දියවැඩියාව,හෘද රෝග,අධික රුධිර පීඩනය,අංශභාගය,පිලිකාව වැනි රෝග හන්දා දවසකට 50 ක්වත් සබරගමු පළාත තුළ මැරෙනවා. ඇයි මේ තත්ත්වය උදා වෙලා තියෙන්නේ. කාරණා කීපයක්. එකක් එක පැත්කින් දියවැඩියාව වගේ දේවල් දෙමව්පියන්ගෙන් එනවා. අනිත් පැත්තෙන් අපේ ශරීර බර , උස හා බර හරි මට්ටමක නොවුණහම මෙහෙම වෙනවා. ඒ එක්කම මානසික පීඩනය බලපානවා. ඒ එක්කම අක්‍රමවත් ආහාර හා නොගැලපෙන ආහාර විශේෂයෙන් පිලිකා කාරක ආහාර භාවිතය මේ කාරණාවට ප්‍රධාන වශයෙන් බලපානවා.

ගරු සභාපතිතුමනි ඒ හින්දා ජාතියක් විදිහට මධ්‍යම රජය වස විෂ වලින් තොර ආහාර භාවිතය ප්‍රචලිත කිරීමට කිනම් වැඩ සටහන් ක්‍රියාත්මක කළද මේක ප්‍රාදේශීය මට්ටමින් පළාත් මට්ටමින් හරියාකාරව ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් මේක සාර්ථක වෙන්නේ නෑ.

ගරු සභාපතිතුමනි විශේෂයෙන් ආහාර ද්‍රව්‍ය හා ආහාර භාවිතය පිළිබඳව කතා කිරීමේදී වර්ණක සහ රසකාරක භාවිතය බරපතල ගැටළුවක්. ස්වභාවික ආහාර පාන පාවිච්චි කරන්න තියෙනවා නම් මේක ගැටළු මතු වෙන්නේ නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි විශේෂයෙන් අද වර්ණක සහ රසකාරක භාවිතය මිනී මරණ උවදුරක් බවට පත් වෙලා තියෙනවා . ඒ නිසා වර්ණක සහ රස කාරක භාවිතය අවම කිරීමට සහ නතර කිරීමට අපි අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. ඒ එක්කම ගරු සභාපතිතුමනි මගේ යෝජනාවේ සඳහන් වෙන පරිදි පලතුරු සහ එළවළු සම්බන්ධයෙන් අපි දන්නවා ගරු සභාපතිතුමනි පැපොල්, කෙසෙල් ආදී ඉදවීම සඳහා භාවිතා කරනවා කාබයින් සහ එතපෝන් කියන ද්‍රව්‍ය දෙක. විශේෂයෙන් කාබයින් සහ එතපෝන් භාවිතා කිරීම සම්බන්ධයෙන් යම් ප්‍රමිතියක් තියෙනවා. එතපෝන් භාවිතා කරන්න එපා කියලා කවුරුවත් කියන්නේ නෑ. හැබැයි කාමයින් සහ එතපෝන් පාවිච්චි කරන විදිහක් තියෙනවා. එතපොන් පාවිච්චි කරන්න නිර්දේශ කරලා තියෙන්නේ එතපෝන් දූමාරය මගින් ඉදවීම. නමුත් ගරු සභාපතිතුමනි අද වෙන කොට බොහෝ තැන්වල එතපෝන් පාවිච්චි කරන්නේ එතපෝන් දූමාරය නෙමෙයි වායුව නෙමෙයි. එතපෝන් යාන්ත්‍රනයේ පලතුරු වර්ග ගිල්වලා. ඒ නිසා සෘජුවම පලතුරු පරිභෝජනයට හුරු වෙන නිසා එතපෝන් කියන විෂ කාරකය ශරීර ගත වෙනවා. ගරු සභාපතිතුමනි ඒ නිසා පලතුරු සහ එළවළු සඳහා මේ රසායනික ද්‍රව්‍ය පලතුරු ඉදවීම සහ කල් තබා ගැනීම සඳහා භාවිතා කිරීම රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ විදිමත් සොයා ගැනීමක් සහ පර්යේෂණයක් කිරීම අත්‍යාවශ්‍යයි ගරු සභාපතිතුමනි. ඒ එක්කම ගරු සභාපතිතුමනි මේවා පිළිබඳව යම් යම් මතභේද නැත්තේ නෑ. එළවළු වල තියෙන අධික කෘෂි රසායනික ද්‍රව්‍ය බරපතල උවදුරක් බවට පත් වෙලා තියෙන කෘෂි රසායනික භාවිතය අවම භාවිතය කියලාත් පිළි ගන්නවා. පහුගිය දවස්වල ගරු සභාපතිතුමනි සැප්තැම්බර් 09 වෙනිදා ගන්නෝරුවේ පැවති ඩබ්ළුඑච්ඕ වාර්තාවට අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයෙ වාර්තාවට අනුව කිය වෙනවා අපේ රටේ එළවළු සඳහා භාවිතා වෙන කෘෂි රසායනික මට්ටම කමක් නෑ කියලා. ඒක

සාධාරණීයකරනය කරනවා. එක පැත්කින් අපි කියනවා කෘෂි රසායකින ද්‍රව්‍ය භාවිතය හොද නෑ කියලා. හැබැයි ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තා වලින් එළි දක්වනවා මේ කෘෂි රසායනික භාවිතය කමක් නෑ කියලා. ගරු සභාපතිතුමනි මේවා පිළිබඳව අපිට සැකයක් දෙගිඩියාවක් තියෙනවා. ඒ නිසා නිශ්චිතව මේවා පිළිබඳව ඉගෙන ගැනීම අත්‍යාවශ්‍යයි. එහෙම වෙන්නේ ඇයි. විශේෂයෙන් මේ ගන්නෝරුවේ පැවති වැඩ මුළුවේදී ප්‍රකාශ වෙන්නේ අපිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන්නේ මේ භෝග සම්බන්ධ වාර්තාවයි. හැබැයි ගරු සභාපතිතුමනි මේක විශ්ව විද්‍යාල මහාචාර්යවරු පිළි ගන්නවාද නැද්ද කියන කාරණාව හරියට හෙළිදරව් වෙලා නෑ. අපිට හැබැයි ලොකු විශ්වාසයක් තියෙනවා විශ්ව විද්‍යාල මහාචාර්යවරු පිළිබඳව මේ ක්ෂේත්‍රය පිළිබඳව දන්න අය පිළිබඳව. ඒක තමයි ආසනික් පිළිබඳව හෙළිදරව් කළේ අපේ රටේ විශ්ව විද්‍යාල මහාචාර්යවරු. ඒ නිසා ගරු සභාපතිතුමනි මේක විශ්ව විද්‍යාල මහාචාර්යවරුන්ගේ හුදකලා කටයුත්තක් නෙමෙයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හුදකලා කටයුත්තක් නෙමෙයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ හුදකලා කටයුත්තක් නෙමෙයි. විශේෂයෙන් මේ පිළිබඳව මනා දැනුමක් තියෙන අය විදිහට විශ්ව විද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන්ගේ දැනුමක් ඒකබද්ධ වැඩ සටහනක් තමයි ක්‍රියාත්මක විය යුත්තේ.

ඊළඟට ගරු සභාපතිතුමනි මේ අපි එළවළු සහ පලතුරු සම්බන්ධයෙන් ඒ එක්කම දැන් අලුත් සොයා ගැනීමක් තියෙනවා රුහුණු විශ්ව විද්‍යාලයේ ඒක තමයි කැට්රියන් සහ ආසනික් වැඩිම තියෙන්නේ රතු නාඩුවල කියන කතන්දරය. අපි දන්වා දියවැඩියා රෝගීන් සඳහා සහ විශේෂයෙන් සනි අවම කිරීම සඳහා රතු නාඩු තමයි හොඳයි කියලා කියන්නේ. හැබැයි රතු නාඩුවල පොත්තේ තමයි කැට්රියන් සහ ආසනික් වැඩියෙන්ම තියෙන්නේ කියලා කිව්වහම අපි මුහුණ දෙන්නේ බරපතල කාරණාවකට. ඒ හින්දා කැටිරියන් සහ ආසනික් වැඩියෙන් තැන්පත් වෙන්නේ රතු නාඩුවල නම් මේක බරපතල ගැටළුවක්. ඒ හින්දා මේ පිළිබඳව විධිමත් අධ්‍යයනයක් කරලා මේ පිළිබඳව විධිමත් පරීක්ෂණ පවත්වලා මේ විෂ රසායනික ද්‍රව්‍යවල බැරෑරුම්කම අවම කිරීමේ වැඩ පිළිවෙලකට අපි යායුතුයි ගරු සභාපතිතුමනි. දැන් මේ පිළිබඳව කරුණු සොයා දී මතු වෙච්චි කාරණාවක් තමයි අපි පාවිච්චි කරන ලන්සීට් පිළිබඳව. කෑම ඔතන කඩදාසි පිළිබඳව. ගරු සභාපතිතුමනි ඔය ලන්සීට්වල කෑම ඔතන ද්‍රව්‍යවල ඇලෙන ගතිය නැති කරන්න අපි පාවිච්චි කරනවා යම් කුඩු වර්ගයක්. මේක බරපතල විෂකාරකයක්. ඒ හින්දා ගරු සභාපතිතුමනි කවදාකවත් අපි ලන්සීට් එකේ බත් බෙදුවට පස්සේ ඒක අරගෙන දාගෙන සෝදන්නේ නෑ. ඒකේ දාගෙන අනලා තමයි කන්නේ. ඒ හින්දා ලන්සීට් භාවිතය අපේ ජනතාවට බරපතල විදිහට මරණයට අත වනනවා පාසැල් දරුවන්ගේත්. ඒකේ වැඩිමනත් අපි කියනවා තුනී ලන්සීට් හොඳ නෑ කියලා . ඒ නිසා ඝණකම ලන්සීට් ගන්න කියලා කියනවා. ගරු සභාපතිතුමනි ලන්සීට්වල ගණකම වැඩි කරන්න කැල්සියම් කාබනික් සහ ඩේසියම් කාබනික් කියන රසායනික ද්‍රව්‍ය දෙක භාවිතා කරනවා. ඩේසියම් කාබනික් කෙලින්ම වකුගඩු විනාශ කරන දෙයක්. අනිත් පැත්තෙන් ඩේසියම් තමයි මානසික ආතතියට බලපාන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ විදිහට බලපුවහම අපි පාවිච්චි කරන හැම දේකම වගේ ජනතාවගේ ජන ජීවිතයට සෞඛ්‍යට බරපතල හානි කරන තත්ත්වයක් උදා වෙලා තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි අපි මේවා පිළිබඳව විධිමත් පරීක්ෂණයක් හා අධ්‍යයනයක් කළ යුතුයි. මම මේ යෝජනාව ගේන්න බලපාපු අර මම කලින් කිව්වා වගේ දිනකට 50 ක් මැරෙන අනුමත වෙච්චි එක අද අපේ

පලතුරු වලින් අපි හිතනවා හොඳ පලතුරක් වශයෙන් කොමඩු භාවිතය. හැබැයි ගරු සභාපතිතුමනි දැන ගන්න තියෙන දෙයක් අද වෙන කොට කොමඩු ගෙඩියේත් පස් පහ ගෙන්වන්න ඒකටත් බෙහෙත් විදිනවා කියලා ආරංචියි. ඒකට කුකුල් සායම් විදිනවා කියලා ආරංචියි. මේක එහෙම නම් අපි පාවිච්චි කරන පලතුරු පිළිබඳව විශ්වාසය තියන්නේ මොනවද. මොන පලතුරද හොඳයි කියලා කියන්නේ අවසාන වශයෙන් දිවුල් ගෙඩියේයි බෙලි ගෙඩියේයි ඇරුණහම වෙන කිසිම පලතුරක් පිළිබඳව අද අපිට විශ්වාසය තියන්න බෑ ගරු සභාපතිතුමනි. ඒ හින්දා විශේෂයෙන් එළවළු සහ පලතුරු සම්බන්ධයෙන් අපේ බරපතල විදිහට අවධානය යොමු කළ යුතුයි ගරු සභාපතිතුමනි. මේ සඳහා අපිට ඉන්නේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු . හැබැයි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට නිකන් ගිහිල්ලා ඒ ඒ පලතුරු ද්‍රව්‍යවල රසායනික ද්‍රව්‍ය මොනවාද කියලා හොයා ගන්න බෑ. ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය කරන උපකරන අවශ්‍ය කරන ද්‍රව්‍ය ලබාදීලා ඔවුන්ට පුහුණුව ලබාදීලා මේ පිළිබඳව කඩිනම් වැඩ පිළිවෙලක් සකස් කරන්න ඕනේ කියලා ගරු සභාපතිතුමනි මම මේ සභාවට යෝජනා කරමි. මේක අපිට තනියෙන් කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. විශේෂයෙන් මේක සමගාමී ලැයිස්තුවේ දෙයක්. ඒ නිසා විශේෂයෙන් ඊජ්‍රීය අමාත්‍යාංශයේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ එක්කම අධ්‍යාපන අමාත්‍යාංශය විශ්ව විද්‍යාලවල මහා චාර්යවරු ඒ සියළු දෙනා ඒකරාශී කරගෙන විධිමත් වැඩ පිළිවෙලක් හැදුවොත් විතරයි අපිට අර මම කලින් කිව්වා වගේ දිනකට 50 ක් මැරෙන එක අවම කර ගත හැකි වැඩ පිළිවෙලක් සකස් කර ගත හැකි වන්නේ. ඒ නිසා මේ පිළිබඳව අපධානය යොමු කරන්න කියන ඉල්ලීම කරමින් ස්තුතිවන්ත වෙනවා. බොහොම ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

----------------------------------------------------------

ස්තුතියි ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට. මීළගට ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

----------------------------------------------------------

ගරු සභාපතිතුමනි ඉතාම හොඳ කාලෝචිත යෝජනාවක්. අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. එතුමා ගෙනාපු යෝජනාවේ අන්තර්ගතය මේ වෙන කොට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අතුරලිය රතන හාමුදුරුවන්ගේ ප්‍රධානත්වයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයත් මූලික කරගෙන මේ වැඩ සටහන මේ වෙන කොට රත්නපුර ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අර ඔබතුමා මතු කළා වගේ යම් යම් බහුජාතික සමාගම් විසින් මේකට අත පොවන එක එක පාරට නවත්තන්න බැරි තත්ත්වයක් වෙලා තියෙනවා. අර මැලේසියාවේ පොල් තෙල්වල කොලොස්ටරෝල් වැඩියි කියා ඇමරිකාව කියනවා වගේ ඒකට විරුද්ධව හිටියේ මැලේසියාවට විතරයි එහෙම නෑ කියලා තර්කයක් ගොඩ නගලා ඔප්පු කරන්න පුළුවන් වුණේ. මේක ලොකු ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඒ කෙසේ වෙත්ත ඉතාම කාලෝචිත හා සුදුසුම යෝජනාවක්.

ඒවගේම ගරු සභාපතිතුමනි මට මතක් වෙනවා දැන් මීට ඉස්සර භාණු මුණිප්‍රිය මන්ත්‍රීතුමා කාලයේ අපි හිටියා ශ්‍රී

ලංකා පදනම් ආයතනයේ ෆොපිස කොටගමත් එක්ක කරපු වැඩ සටහනක. සුමාන දෙකක් අපි නේවාසිකව. එතුමා ඉතාම පරිසරවේදියෙක්. මහාචාර්ය කොටගම මැතිතුමා. එතුමා ඒ වකවානුව වෙන කොට මේ රසායනික ද්‍රව්‍ය භාවිතාව පිළිබඳව විශාල වශයෙන් හොයලා තිබුණා. ඔය බලංගොඩ පැත්තේ මහවලතැන්න ප්‍රදේශයේ එතුමාම නැවතිලා බෝංචි වගාව පිළිබඳව බෝංචි වගා කරලා මහජනතාවට බෝංචි ලැබෙන තෙක් ඒ ක්‍රියාදාමය ඇහැට දැකලා සමීක්ෂණය කරපු මහත්මයෙක්. පලතුරු වගේම එළවළු වගේම අපේ ධාන්‍ය වලටත් ඔබතුමා කියන ඔය විෂ රසායනික ද්‍රව්‍ය හා නොයෙකුත් දේවල් යොදා ගන්නවා කියලා අපි දන්නවා. දැන් පහුගිය කාලයේ ඔය බලංගොඩ පැත්තේ බෝංචි වවන කොටු තියෙන ගෙවල්වල මැටියෙන් හදපු ගෙයක් තියෙනවා හොඳ මේකට තමයි බෝංචි ටික කඩලා ගෙනත් දාන්නේ. බෝංචි ටික කඩලා තුනී කරලා ද්‍රාවණය අඩු රසායනික ද්‍රව්‍ය මේකට ඉසිනවා. උදේ පොළට ගෙනියන්න. එතකොට උදේ බෝංචි පොළට ගෙනි යන කොට එවලේ කඩපු බෝංචි වගේ ඇත් දළ වගේ ලස්සනට බෝංචි ටික තියෙනවා. අපේ මිනිස්සුත් ගිහිල්ලා ලස්සනට තියෙන බෝංචි ටික තමයි ඒ ගොඩෙන් ගන්නේ. ඒක අපි පාරිභෝගිකයෝ පැත්තෙන් අපි ලොකු අපහසුතාවයට පත් වෙනවා. පොඩ්ඩක් මැල වෙච්චි බෝංචි කරලක් ගත්තොත් එහෙම ඌ ලෝභයෙක් කියනවා. අර ලස්සන ඇත් දළ වගේ බෝංචි කරල් ගන්න තමයි අපි කවුරුත් පෙළඹෙන්නේ. හැබැයි ඒවේ තියෙන රසායනික සංගටක කොච්චර තියෙනවද කියලා අපි ඒ ගැන හිතන්නේ නෑ. ඇත්ත වශයෙන්ම මේ දේවල් ක්ෂණිකව වෙළඳ පොළට ගේන්න මිනිසුන්ට ක්ෂණිකව මුදල් අවශ්‍යතාවය එහෙම නැත්නම් මිනිසුන්ගේ ඉල්ලීම කොච්චරද කියලා මේ එළවළු පලතුරු වලට කියලා තමයි මේ ප්‍රශ්නය ඇති වෙන්නේ. අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ පැණි කොමඩු පැණි පුහුල් කියලාත් ගමේ භාවිතා කරනවා. මේ සඳහා රසායනික ද්‍රව්‍යක් නැත්නම් කුකුල් සායම් යොදලා ඒක රතු පාට කරන්න අපි උත්සාහ කරන්නේ අපි වැඩියෙන් කැමති රතු පාට වෙච්චි ඒවා ඉදිලා කියලා වැඩියෙන් ගන්න. ඒවගේම වෙළඳ පොළට වැඩියෙන් පැණි පුහුල් ඕන වුණහම ඉන්ජෙක්සන් එක ගහලා වෙළඳ පොළට දානවා. මේ දෙගොල්ලෝම දැනුවත් වෙන ව්‍යාපරයක් වෙන්න ඕනේ. ගොවියා නිෂ්පාදකයා දැනුවත් වෙන්න ඕනේ මෙවැනි දේවල් මහජනතාවට දෙන එක අපේ ආගමානුකූලව බැලුවත් ඒක මහා විශාල වරදක්. විශාල පාපයක්. ඒ පිළිබඳව අවබෝධයක් ඇති කරලා දෙන්න. ඒවගේම භාණ්ඩ මිළදී ගන්නා පාරිභෝගිකයා ඒ අයත් දැනුවත් වෙන්න ඕනේ. ඒ නිසා ඔබතුමාගේ යෝජනාව කෘෂිකර්ම අමාත්‍යාංශයට පමණක් නෙමෙයි අධ්‍යාපන අමාත්‍යාංශයත් සම්බන්ධ කරගෙන කුඩා කළ සිට ඒ ළමයි දැනුවත් කරලා යම්කිසි වැඩ පිළිවෙලක් කරා ගන්න අවශ්‍ය වෙනවා. එයින් මේක අපිට දීර්ඝ කාලීනව විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙනවා. ඔබතුමාගේ යෝජනාව අනුව මහජන පරීක්ෂකවරුන් යොදවලා අපිට යම් ප්‍රමාණයක් මේක මැඩ පවත්වා ගන්න පුළුවන්. යම්කිසි පොඩි ප්‍රමාණයක් මේක මැඩ පවත්වා ගන්න පුළුවන් වෙනවා. හැබැයි දෙපාර්ශවයම දැනුවත් කිරීමෙන් පමණයි මේකට දීර්ඝ කාලීනව විසඳුමකට අපිට යන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා දැනට වැඩිහිටියෝ දැනුවත් කරනවා වාගේම පාසැල් මට්ටමේ දරුවන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලකුත් අතිශයින්ම වැදගත් වෙනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්නට වෙනවා. ඒ එක්කම අර පලතුරු ඉදවන්න හෝමෝන එකක් යොදවනවා. ඇත්තටම ඉස්සර අපේ ගෙවල්වල දානයක් තියෙනවා කිව්වහම ඉස්සරම කපන්නේ කෙහෙල් වල දාන්න වලක්. පොඩි එවුන්ගේ වැඩේ මේ කෙහෙල් වලට

කෙහෙල් දාපු වෙලේ ඉදලා උදේට දවල්ට නැත්නම් හවසට මේකට දුම් පිබින එක. දුම් ගහලා තමයි කෙහෙල් ඉදවන්නේ. දැන් ඒ මොකුත් ඕනේ නෑ බණ දවසේ උදේ ගිහිල්ලා ගේනවා කෙහෙල් කැනක්. කෙහෙල් කැනේ ගෙඩි වලට ගහනවා ස්ප්‍රේ එක. ගහපු ගමන් දානෙට කෙහෙල් හරි. හැබැයි කෙහෙල් ගෙඩිය කහ පාට වුණාට. ඇතුලේ කෙහෙල් ගෙඩිය කන්න බෑ. කටේ කහට රහ නැත්නම් තිත්ත රහ ඒක අමුතු රසක් ඇති වෙනවා. ඇතුළේ ඉදිලා නෑ පිට කහ පාටයි. හැබැයි මේක අපිට ස්වභාවික විදිහට ඉදිච්ච කෙහෙල් ලේල්ලක් අරගෙන පෙට්ටියට දාලා කෙහෙල් ලෙලි කීපයකුත් එක්ක මේ පෙට්ටියට දානවා නම් ඒක ස්වභාවික විදිහට ඉදෙන්න පුළුවන්. නැත්නම් බිලිං කොළ ටිකක් දැම්මහම කැප්පෙට්ටියා කොළ ටිකක් දැම්මහම ඒක ගමේ විදිහට ඒක මේ කෙහෙල් ඉදව ගන්න එක එච්චර අපහසුතාවයක් නෙමෙයි. හැබැයි කවුරුත් බලන්නේ පහසුව. බලලා මොකද කරන්නේ ඒකට ස්ප්‍රේ එකක් ගහලා කෙහෙල් ගෙඩිය ලස්සනට තියා ගන්න තමයි ගාන දෙන කට්ටිය ඕන වෙන්නේ. ඒක නිසා තමයි මම අර මුලින් කිව්වේ දැනුවත් වෙන එක වැදගත් වෙනවා. දෙපාර්ශවයටම. නිෂ්පාදකයා පාරිභෝගිකයා දෙපාර්ශවයම දැනුවත් කරන්න සිද්ධ වෙනවා. නිෂ්පාදකයා දැනුවත් කරන්න සිද්ධ වෙනවා. මේක අපි කරන ජාතික ව්‍යවසනයක්. මේක ආගමානුකූල පාපයක්. සියළු ආගම් දිහා බැලුවහම නුසුදුසු ආහාර සහ වස විෂ ආහාර අනුභවයට සැපයීම ලොකු පාපයක් කියන එක අපි නිෂ්පාදකයා දැනුවත් කරන්න ඕනේ. ඒවගේම ගන්න අපිත් දැනුවත් වෙන්න ඕනේ. ගිහිල්ලා බලලා හරි දේ සුදුසු දේ අපිට ගන්න අපි දැනුවත් වෙලා ඉන්න ඕනේ.

ඒ එක්කම අපි දන්නවා ගරු සභාපතිතුමනි අපිට දීර්ඝකාලීන වශයෙන් ගත්තොත් අපේ දේශීය වී වර්ග තිබුණා. කලුනික කියයි. කුරුළු තුඩ කියයි. අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා නිතරම කියන මේ සුවදැල් වැනි වර්ග හැංගිමුත්තන්,පච්චපෙරුමාල් මෙවැනි වී වර්ග තිබුණා අපේ ඉතිහාසයේ. මඩතවාලු. ඒ පරණ වී. හැබැයි අපිට උග්‍ර ජල හිඟයකට මුහුණ පාන්න සිද්ධ වෙලා තියෙනවා. මෙවැනි පැරණි වී වර්ග වගා කිරීමේදී අපිට ජලය යන්නේත් බොහොම අඩු ප්‍රමාණයක් ගරු මන්ත්‍රීතුමා. ඒක නිසා මේ දේශීය දේවල් ස්වභාවික විදිහට අපිට සකස් කර ගන්න පුළුවන්කම තියෙද්දී ඔබතුමා කිව්ව අර ලෙඩ වට්ටෝරුවෙන් අපිව නිදහස් වෙන්න අපිට ශරීර සෞඛයෙන් නිදහස් පුද්ගලයෝ හැටියට මේ සමාජයේ ජීවත් වෙන්න පුළුවන් අවශ්‍ය ආහාර රටාවක් අපිට තිබුණා. හැබැයි ඒ රටාවෙන් අපි නිදහස් වෙලා ගිහිල්ලා ආහාර ප්‍රමාණයක් අපිට තිබුණා. ඒ ප්‍රමාණයෙන් වෙනස් වෙලා ගිහිල්ලා අපි යම් යම් ක්ෂණික විදිහට ඉක්මනින් අපිට හැඩ ගැහිස්සි නිසා තමයි අපිට මේ විදිහ වෙලා තියෙන්නේ. ඒ නිසා ඔබතුමාගේ යෝජනාව ඉතා වැදගත්. එක පැත්තකින් නිෂ්පාදකයා දැනුවත් කරන එක පැත්තකින් පාරිභෝගිකයා දැනුවත් කරන්න අනිත් පැත්තෙන් පාසැල් යන දහම් පාසැල් යන දූ දරුවෝ දැනුවත් කරන්න ඒවගේම අපේ රට විශාල සම්පතක් වෙලා තියෙන ජලය අපිට දේශීය වී වගාව නිෂ්පාදනය කරන්න පටන් ගත්තොත් අපිට පුළුවන්කම ලැබෙනවා ජලය සම්බන්ධයෙනුත් අපිට අඩු ප්‍රමාණයක් පාවිච්චි කරලා අපේ දේශයට ජලය ඉතුරු කර ගැනීමට. ඒක නිසා මේක ඉතා වැදගත්. වර්තමානයේ අපි බලපොරොත්තු වෙන විදිහට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරහා ක්ෂණිකව දැනුවත් කිරීමෙන් මේ වැඩ පිළිවෙල ක්‍රියාත්ම කරන්න ඒ උදවියට යම්කිසි භාණ්ඩයක නැත්නම් උපකරණයක

අඩුපාඩුවක් තියෙනවා නම් එය සම්පූර්ණ කරලා දීලා ඒ දේවල් වලින් ඒ කාර්යය ඉෂ්ඨ කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා දෙන්න කියලා ඉල්ලමින් එතුමාගේ යෝජනාව ස්ථිර කරමින් මගේ වචන කීපය හමාර කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු වෛද්‍ය පරාක්‍රම අතාවුද අපේ ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී පරාක්‍රම අතාවුද***
***கௌரவ உறுப்பினர் பராக்கரம அதாவுத***
*Hon.Member Parakrama Athawuda*

----------------------------------------

ගරු සභාපතිතුමනි අපේ හිතවත් සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරමින් ඉතාම කාලෝචිත යෝජනාවක් එතුමා මේ සභාවට ගෙනත් දීලා තියෙනවා. ගරු සභාපතිතුමනි මේ ලෝකයේ විශාල දියුණුවකට පත් වුණා කාර්මික විප්ලවයත් සමඟ. යුරෝපයේ රටවල් අතිදැවැන්ත පිම්මක් පැනලා දියුණු වුණා. මේ දියුණුවත් සමඟ මේ ලෝකයේ මේ දියුණු වුණ රටවල් වල ඒ දියුණුවේ අතුරු ඵලයක් ලෙස උදා වුණා ඒ රටවල්වල තිබුණ සංස්කෘතිය සදාචාරය ඒවේ තිබුණ සාරධර්ම බිඳ වැටෙන්න පටන් ගත්තා. ඒකත් ඒ දියුණුවේ එක කොටසක්. දැන් තමුන්නාන්සේලා අපි කල්පනා කරලා බැලුවොත් අද පරිගණකයක් ගත්තොත් මේ පරිගණකයේ ළඟට ගියාම විශ්ව දැනුමක් අපිට ලබා ගන්න පුළුවන්. එවන් දෙයක් අපේ පුස්තකාලයක් ළඟට ගියා වගේ තමයි පරිගණකය ළඟ තියෙන කොට. ඒක තමයි ඒ දියුණුවේ එක්තරා හොඳ පැත්තක්. ඒවගේම මේකේ නරක පැත්තක් තමයි දැන් ඊයේ පෙරේදා තිබුණා සාමාන්‍ය පෙළ උසස් පෙළ විභාගය. ඒ විභාගය හොඳට පාස් වුණහම ඒ විභාග දරුවන් හොඳට ලකුනු ගත්තහම දෙමව්පියන් පුතේ මම පුතාට ගෙනත් දෙනවා හොඳ දුරකථනයක්. මේක ඇපල්,මේක ත්‍රී ජී. මේකේ තව නානාප්‍රකාර දේවල් තියෙනවා. දරුවා මේක ගන්නවා බොහොම ආදරයෙන්. තාත්තා හිතනවා මේ දුව හොඳට ඉගෙන ගනියි මේක අරගෙන. නමුත් තාක්ෂණයේ අනිත් පැත්ත මොකක්ද. මේ කෙල්ල හෝ කොල්ලා මේක ඔබලා ඔබලා ගන්නේ අර කුණුහරුප ටික. මේක තමයි තාක්ෂණයේ අනිත් පැත්ත. ඒකත් එක කොටසක්. ඒහා සමානව දෙයක් තමයි මේ ශරීර සෞඛ්‍ය. යුරෝපයේ මේ කාර්මික විප්ලවය එන කොට එක පාරට ඒ රටවල්වලත් දියවැඩියාව වැඩිවෙන්න පටන් ගත්තා. අධික රුධිර පීඩනය වැඩි වෙන්න පටන් ගත්තා. ආතතිය නිසා ආසාදන රෝග වැඩි වෙන්න පටන් ගත්තා. මෙවන් තරබාරු මිනිස්සු වැඩි වෙන්න පටන් ගත්තා. දැන් මොකක්ද කරන්නේ. ඒවාට වියදම් කරන්න සිද්ධ වුණා මේවගේ තවත් එහා ගුණයක් වියදම් කරන්න වුණා ඒ දියුණු වෙච්චි කාර්මික විප්ලවයෙන් පස්සේ ඒ රටවල් වලට. දැන් ඒහා සමානව සිද්ධියක් සිද්ධ වීගෙන යනවා අපේ රටවලත් කියලා මට පේනවා. එතකොට එදා ඒ කටයුත්ත සිද්ධ වෙන කොට අද අපේ රටේ බොහෝ දෙනා යනවා. ජිම් ජිම්. ඔක්කෝම ජිම්. ඒ කාලයේ අපේ කාන්තාවෝ පිටි කොටනවා. මේක පද්දලා ගහන්න ඕනේ නැත්නම් හරියට පිටි කෙටෙන්නේ නෑ. එතකොට කොන්ද හොඳයි. ඇඟ පත හොඳයි. හොඳ ශරීර සෞඛ්‍ය සම්පන්න පිරිසක් එදා හිටියා. අද පිටි කොටන්නේ නැනේ අපේ කාන්තාවෝ. එතකොට දැන් ජිම් එක ඕන වෙනවා. නමුත් ඒ කාලයේ ඒක වුනේ

නෑ. මේ දියුණුවත් සමඟ වුණ එක දෙයක් තමයි ඒක. එතකොට අපි මේ දියුණුව පසුගිය දස වසර තුළ අති දැවැන්ත පනින පිම්මක් පැනලා තියෙනවා. එක්තරා ආර්ථික විශේෂඥයෙක් කියනවා මේ රටේ ආර්ථික දියුණුව පටන් ගත්ත යුගය ගැන ඒ ආර්ථික විශේෂඥයා ලියනවා ලංකාව ගැන මේ ලංකාවේ ආර්ථිකය දියුණු වෙන්නේ කොහොමද කියනවා නම් මේක හරියට ගුවන් යානාවක් ගුවන් පතේ දිගේ ගිහිල්ලා ගිහිල්ලා ගුවන් ගමන් කරන්න ආරම්භ කරන මොහොත වගේ කියලා අපේ රටේ ආර්ථික සංවර්ධන යන වේගය ඒ වගේ කියලා කියනවා. එතකොට අපිට හිතා ගන්න පුළුවන් ප්‍රස්ථාරය ගහපුවහම මේ ප්‍රස්ථාරයේ අපි ටික ටික ආවේ. මෙහෙම ඇවිල්ලා මෙහෙම යන්න යන්නේ. දැන් වසර ගාණක ආවා. එතකොට මේ දියුණුව වෙන කොට දැන් අපි මේ කෑම බීම පිළිබඳ අපේ එච්චර තැකීමක් නැති වුණා. අපිට දුවන්න වුණා මුදල් සොයන්න. ඒකේ අතුරු ඵලයක් වශයෙන් තමයි මේ වස විෂ දේවල් මේ රටට එන්න පටන් ගත්තේ. මොකද කන්න ඕනේ බොහොම දේවල්. නමුත් ඒවා සාමාන්‍ය ගොවිතැන් කරලා හදා ගන්න බැරි නම් කෘතිමව හෝ වගා කරලා ඒ කටයුත්ත කර ගන්න ඕනේ. ඒ නිසා තමයි මේ වස විෂ විශාල වශයෙන් රටට ඕන වෙලා තියෙන්නේ. දැන් එළවළු තියෙනවා. පලුරු තියෙනවා. වෙනත් පලතුරු වර්ග අපේ කොටස් වලට බෙදලා ගත්තහම මේ පලතුරු පිළිබඳව තමයි මේ අපේ මන්ත්‍රීතුමාගේ විශාල අවධානයක් යොමු වෙලා තිබුණේ. මේ පලතුරු ඉදවන්නේ කොහොම ඉස්සර. ඉස්සර ඉදවන්නේ අපේ කිරි අම්මලා වලක් කපලා ඒක වහලා පොඩි හිලක් තියලා තියෙනවා. ඕකට දානවා කැප්පෙට්ටියා කොළ. ඕකට අරවා මේවා දාලා දුම් ටික ගහනවා. මේ ගහපුවහම ඇසිටිලින් වායුව මගින් තමයි මේක හදන්න කියලා කියන්නේ. අපේ කිරි අම්මලා ඒක නොදැනෙන්න ඇති. නමුත් විද්‍යාත්මක හේතුව ඒකයි. තව උදාහරණයක් කියනවා නම් අපිට ඉස්සර අපිට මතකයි අපේ කිරි අම්මලා රෑට කෑම කාලා ඉතුරු වෙන බත් ටික තියලා තියනවා. ඒක උදේට ආයේ වතුර ටිකක් එහෙම දාලා කනවා. අද අපේ ගැබිණි අම්මලා ගැබිණි අම්මලා යනවා සායනයට ,සායනයට ගියහම දෙනවා පෝලික්ඇසිඩ් ,කැල්සියම් ලැක්ටේට්,ෆෙරසල්පේට්, ඒ කියන්නේ යකඩ,කැල්සියම් මේවගේ දේවල් දෙනවා. එතකොට අපේ ආදිමත් කාලයේ අපේ කිරිඅම්මලා අපේ අම්මලා අපි ඉපදෙන කොට මේ පෝලික්ඇසිඩ් දුන්නේ නෑ. මේ පොලික්ඇසිඩ් වලින් තමයි ඒ දරුවාගේ මොළේ ස්නායු පද්ධතියේ විශාල ශක්තියක් ලබා දෙන්නේ. එතකොට අර වතුර දාලා උදේ කන කෑම එක තමයි පෝලික්ඇසිඩ් බහුලව කියලා දැන් අපේ සෞඛ්‍ය හොයාගෙන තියෙනවා. අපි මොන තරම් කොහොම හිටිය ජාතියක්ද. එතකොට අපි අද ඉඳවන්න දානවා කාබයිඩ්. අපේ සලිත මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා. කැල්සියම් කාබයිඩ් දැන් මේවා ගහන්න ප්‍රමිතියක් තියෙනවා. නමුත් ප්‍රමිතියක් නෑ. තමුන්නාන්සේලා දන්නවා මේ හම්බෙගමුව ඇඹිලිපිටිය , මේ එහා පැත්තේ පළාත් වලින් තමයි කෙහෙල් ගෙනි යන්නේ. හම්බෙගමුව තමයි ලංකාවේ ලොකුම කෙහෙල් කන් වෙළඳ පොළ. ඕකට ගිහිල්ලා කෙහෙල්කන් ගෙඩි ටික ගහනවා ලොරියට. කොළම කොළ පාටයි. හැබැයි ගහලා ඉවර වෙන කොටම ගැහුවා කාබයිඩ් වක්කරලා මේ රත්නපුර අවිස්සාවේල්ල පහු කරලා යන කොට කහ පාට වීගෙන එනවා. බාන කොට කහ පාට රතු පාට වෙලා. අපි මේවා කනවා. මේ කෑම වැඩිපුර අධි මාත්‍රාව කාපු නිසා තමයි මෙන්න අපිට ලෙඩ හැදෙනවා. විශේෂයෙන්ම මේ වෙද්දී ඇති වෙන්නේ මධ්‍යම ස්නායු පද්ධතියේ ප්‍රශ්නයක් ඇති කරනවා. එතකොට අපේ දරුවෝ ඉගෙන ගන්නේ කොහොමද. ඒ අයගේ මතක ශක්තිය කොහොමද. ඊළඟට අක්මා ප්‍රශ්න ඇති වෙනවා. මෙන්න මේ කාරණා ඇති වෙන්නේ අධිමාත්‍රා මේ අනවශ්‍ය දේවල් මේකට යොදා ගැනීම

තුලින්. ඒ විතරක් නෙමෙයි දැන් මොකක්ද ගහන්නේ. දැන් කාබයිට් නෙමෙයි ගහන්නේ එතිෆෝන්. මේක ඊටත් වඩා දරුණුයි. මේ නිසා තමයි ඒ දරුවන්ගේ විශාල අකරතැබ්බ වලට මුහුණ පාන්නේ. දැන් ඇමරිකා එක්සත් ජනපදයේ යුරෝපයේ රටවල් මේවාට දෙන්න පුළුවන් යම්කිසි ප්‍රමාණයක් තියෙනවා. ඒ මාත්‍රාව තමයි ඒගොල්ලෝ කියන්නේ. මිදි වලට මෙච්චරක් ගහන්න ඕනේ. ඒවගේම ඇපල් වලට මෙච්චරයි. එහෙම නැත්නම් අන්නාසි වලට මෙච්චරයි කියලා මාත්‍රාවක් තියෙනවා. මේ මාත්‍රාවට කටයුතු කරන්න කියලා තමයි කියන්නේ. දැන් අපේ රටේ මාත්‍රා නැනේ. ගේනවා ගහනවා. විකුණනවා. එතකොට මේවා ගැන සොයා බලන්න ඕනේ. කවුද මේවා සොයා බලන්න ඕනේ. ඉතිං සොයා බලන්නත් යම්කිසි කොටසක් අපිට ඕන වෙනවා. දැන් ඊළඟට අපි බලාගෙන යන කොට මේ පලතුරු විතරක් නෙමෙයි. මේ පලතුරු කාබයිට් සහ යම්කිසි දෙයක් ගහලා කියලා අපිට හඳුනා ගන්න පුළුවන්. මේවේ රස එහෙම නෙමෙයි. මේවේ එක එක ලප ජාති ජේනවා. එවගේම එළවළුවල කොළය හොඳයි. හැබැයි ගෙඩිය බොහොම හොඳට තියෙනවා. ඉතිං මේවගේ වෙනස්කම් තියෙනවා. මට මතකයි මම මීට වසර පහකට හයකට කලින් මම නුවර එළියේ ගියා. යම්කිසි වැඩ සටහනකට. එදා රාත්‍රියේ අපි එහේ හිටියා. අපි උදේ බලන කොට පාත්ති හදලා තියෙනවා. නුවර එළියේ ගෙවල් ළඟ. කැරට් තියෙනවා. බීට් තියෙනවා. එක්තරා මහත්තයෙක් ඇවිල්ලා වැඩ කරනවා. තොප්පියක් දාගෙන. එතන වෙනම පාත්තියක් තිබුණා. මම ඇහුවා මොකක්ද මේ පාත්තිය කියලා. කොළ ජාති දාලා තියෙනවා. ගොම දාලා තියෙනවා. සර් මේ මගේ දරුවන්ට කෑම හදන පාත්තිය. මම ඇහුවා ඇයි මේ. නෑ සර් අපි මේකට වස විෂ ගහන්නේ නෑ. අපි මේවාට ගහනවා. මොනවද ගහන්නේ. ගොවා හදලා තිබුණා. මොනවද ගහන්නේ කියලා ඇහුවා. සර් මේකට හාපික් ගහනවා. මම ඇහුවා ඇයි හාපික් ගහන්නේ. හාපික් ගැහුවහම මේ ගෝවා ගෙඩිය දින 14 . 15 ක් තියා ගන්න පුළුවන් කියනවා. ඉතිං මේ ගොවියා තමාගේ දරුවාට දෙන්නේ මොනවද. එතකොට ඒ පියා තමාගේ දරුවාට දෙනවා නම් ලෝකයේ තියෙන හොඳම කෑම වට්ටෝරුව දෙන්න උත්සාහ කරනවා නම් ඒ විදිහටම හදලා දෙනවා නම් අනිත් දරුවන්ට හාපික් ගහලා කක්කුසි හෝදන ටික ගහලා දෙනවා නම් පරාසයක් තියෙනවා එතන. ඒ නිසා මෙන්න මේවා වලක්වා ගන්න අපි කටයුතු කරන්න ඕනේ. ඒ සඳහා අපේ මොක්කද ක්‍රියා කලාපය. අපේ වැඩ සටහන මොක්කද. මෙන්න මේකට තමයි අපි එන්න ඕනේ.

ඒ විතරක් නෙමෙයි තමුන්නාන්සේලා දන්නවා මේ මාළු. දැන් මාළු තියෙන කොට අපි බලනවා කරමල උස්සලා රතු පාටයි. එක මැස්සෙක්වත් මේකේ නෑ. මාළු හොඳයි. මාළු ගිහින් අරන් ගියා. මොනවද මේකට ගහන්නේ. ෆෝමලින්. ෆෝමලින් කියන්නේ මොනවද. පිලිකා කාරක. ෆෝමලින් ගහන මාළු කන්නේ. ෆෝමලින් ඒකට විතරක් නෙමෙයි තව ගහනවා යෝගට්වලට. අර කිරි ඒවාටත් ගහනවා. ඒ විතරක් නෙමෙයි. ටෝපී කියලා මුස්ලිම් ජාතිය කන කෑමක් තියෙනවා. මේ ඔක්කෝටම ගහනවා ෆෝමලික්. ගහලා මේවා විකුණනවා. ගහලා විකුණුවාට පස්සේ අපේ දරුවන්ට මොකක්ද හැදෙන්නේ. පිලිකාව හැදිලා. තමුන්නාන්සේලා දන්නවා. අවුරුදු හයේ,හතේ,අටේ ළමයින්ට දියවැඩියාව. පොඩි ළමයි එනවා මම ඉස්පිරිතාලයේ වැඩ කරන කාලයේ. අනේ දරුවාට දියවැඩියාව හැදිලා. සමහරක් අයට අක්මාවේ ප්‍රශ්න. වකුගඩු ප්‍රශ්න නිසා මේ ළමයින්ට අධික රුධිර පීඩනය හැදිලා. මේවා හැදෙන්නේ කොහොමද. මෙන්න මේවගේ යම් විෂ ජාති අපේ ඇගට ඇතුල්

වෙන නිසා. මේවාට හාල් වර්ග තියෙනවා. දුඹුරු පාට හාල් වර්ග මේවාට බොහොම හොඳයි. මේවා හොඳයි ශක්තිය හොඳයි කියලා කනවා. නමුත් හාල් ටික ගෙනල්ලා වතුර ටික දාලා හොදන කොට රතු පාටයි. ඇයි ඒවාට දාලා පාට. මේ පාට දාන්න ප්‍රමිතියක් තියෙනවා. මේ ලංකාවේ තියෙනවා ප්‍රමිතියක් මෙන්න මේ මාත්‍රාවෙන් පාට දාන්න පුළුවන්. අහවල් දේවල් වලට තමයි මේ පාට දාන්නේ කියලා. ඒකට තියෙනවා ඊ අංකයක්. මේ ඊ අංකය මොනවද ගහලා තියෙන්නේ. තමුන්නාන්සේලා ගිහිල්ලා බලන්න. එතකොට මේවා බලන්නේ කවුද. කවුද මේවාට වගකියන්නේ. ඉතිං මේවා ගැන තමයි අපි සාකච්ඡා කරන්න ඕනේ. ඒ සඳහා මම යෝජනාවක් කරනවා තමුන්නාන්සේලාට ඒ යෝජනාව මම මගේ කතාව අවසානයේ කරන්න බලාපොරොත්තු වෙනවා. ඊගාවට මිරිස් කුඩු වලටත් එහෙමයි. ඒකටත් පාට ගහනවා. අනිත් කතන්දරය තමයි පොල් තෙල්. පොල් තෙල් එක වරක් බැද්දට පස්සේ ඒ පොල් තෙල් අර කොලොස්ටරෝල් වලට සමාන අර තැට් ඇසිට් කියලා බැදෙනවා. මේවා කෑම තුළින් එක පාරක් බැදලා ගන්නවා දැන් හෝටල්වල එක පාර,දෙපාර,තුන් පාර බැදලා ගන්නවා. මේවා තුළින් කරන්නේ අපේ ඇගේ දේවල් වැඩි කරලා අධික රුධිර පීඩනය,හෘදයාබාධ මේ ඔක්කෝටම හේතු වෙනවා. මේකේ භයානකම ක්‍රමය වෙනත් රට වලින් මෙසේ පාවිච්චි කරන ලද පොල් තෙල් මේ රටට ආනයනය කරලා සමහර වෙළඳුන් ඒවා විකුණනවා ලාභයට. අපේ අය ගන්නවා. අපේ අය මේවෙන් බදිනවා. බැදලා දෙනවා. දීලා කෙලවනවා අපිට. අපිටමයි වෙන්නේ. ඒ නිසා අපි මේවා කෙරෙහි විශාල වැඩ සටහනක් එකතු කරන්න ඕනේ කියලා තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා.

ඒවගේම තමයි මෑත කාලයේ මේ රටේ ආන්දෝලනයක් වුණා ඩීසීඩී පොඩි ළමයින්ට දෙන පිටිවල ඩීසීඩී අඩංගු වෙලා තියෙනවා. මොනවද මේ ඩීසීඩී කියන්නේ. ඩීසීඩී කියන්නේ යූරියා හදන අතුරු ඵලයක්. දැන් නවසීලන්තය,ඕස්ට්‍රේලියාව වගේ රටවල්වල විශාල වශයෙන් මේ කිරි කර්මාන්තය තියෙන රටවල්. එතකොට මේගොල්ලෝ මේ කිරි දොවලා මේ හරකුන්ට කන්න දෙනවා තණ කොළ. තණ භූමි. හෙක්ටයාර් දහස් ගණන් තියෙනවා තණ භූමි. හැබැයි මේ රජයවල් වලින් මේ විශාල හරකුන් ප්‍රමාණයක් මේවා කාලා ඒ මුත්‍රා කරනවා. ඒ අය බහිස්‍රාවය කරනවා. මේ ඔක්කෝම ඒ තණ බිමට වැටුණහම වැහි කාලයට මේ සේරම ගලාගෙන යනවා වැහි ජලයත් සමග ගංගා ඇළ දොළ වලට. ඒකේ තියෙනවා නයිට්‍රජනීය එක එක දේවල් ඇති වුණහම මේවා ටික වාෂ්ප කර ගන්න ඕනේ. ඒ නිසා තමයි මේ ඩීසීඩී දාන්නේ මේ තණ කොළ වලට. මේ තුළින් මේ තණ කොළ වලට ඩීසීඩී දැමීම තුළින් ඒ නයිට්‍රජන් විනාශ වෙලා යනවා. නමුත් මේ හරකා මේ තණ කොළ කාපුවහම ඒවා හරකාගේ කිරි වලට ඇවිල්ලා ඒ මාර්ගයෙන් මේ ඩීසීඩී ප්‍රමාණය වැඩි වුණහම අන්න අපේ දරුවාට හැදෙනවා ලෙඩ රෝග. ගරු සභාපතිතුමනි තව මට මිනිත්තු කීපයක් ලබා දෙන්න මොකද මේක කිව යුතුම කාරණාවක්. එක නිසා ඒ දරුවන්ගේ තත්ත්වය ඒකයි. ඊළගට වතුර. ඒවාට අපි පොහොර දානවා. පසුගිය කාලයේ අති දැවැන්ත විප්ලවයක් මේ රටේ සිදු වුණා. විශාල වශයෙන් මේ පොහොර. ඒක නිසා නෙමෙයි ඊට කලිනුත් පොහොර දැම්මා. ඒ පොහොරවල තියෙනවා කැට්ට්‍රික් ආසනික් ,ඊයම් මේවා බර ලෝහ. ඒවගේම දැන් මේ අලුතින් දුරකථන,පරිගණක මේ ඉලෙක්ට්‍රෝනික් අපද්‍රව්‍ය තුළින් මේවා ගියහම අන්න අද පොළොන්නරුවේ, අද අනුරාධපුරයේ, අද මඩකලපුවේ ,ත්‍රිකුණාමලයේ,දකුණේ අපේ සහෝදර ජනතාවට සිද්ධ වෙලා තියෙන දේ දැක

ගන්න පුළුවන්. අද අපේ රජයට ඒ සඳහා විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වෙලා තියෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට විශාල වැඩ කොටසක් කරන්න සිද්ධ වෙලා තියෙනවා. මෙන්න මේක තමයි කටයුත්ත. අපේ පසුගිය රජයවල් මට මතකයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය 1970 ගෙනාවා මේ කෑම උයලා දෙන්න මේ දරුවන්ට කියලා. ඒහා සමානව විප්ලවයක් කරන්න බැලුවා පසුගිය රජයේ. දිවි නැගුම වැඩ සටහන යටතේ ඇට ටික බෙදුවා. පැළ ටික බෙදුවා. කාපල්ලා කිව්වා. හොඳ ඒවා කාපල්ලා කිව්වා. ඒ අඩුපාඩු කතා කළා මිසක් අඩුපාඩු නැති එකක් නෑ. ඒ ගැන කතා කරලා ඉවරයක් නෑ. මේවා අපේ දරුවන්ට හදලා දෙන්න ඕන දේවල්. හොඳ දේවල් තියෙනවා. නරක දේවල් තියෙනවා. නමුත් හොඳ දේ හොඳයි කියලා අපි පිළිගන්න ඕනේ. ඒකේ අඩුපාඩුවක් තියෙනවා නම් ඒ අඩුපාඩුව අපි හදා ගන්න ඕනේ. ඒ නිසා අලුත් වැඩ සටහන් අපි මේකට ගේන්න ඕනේ. දැන් කවුද මේකට උත්තර දෙන්නේ. මේකට උත්තර දෙන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්. එතකොට සෞඛ්‍ය අමාත්‍යාංශයේ එම්.ඕ.එච්.මහත්තුරු තමයි මේ කටයුත්ත කරන්නේ. ඒකට පී.එච්.අයි.මහත්තුරු ඉන්නවා. නමුත් මේ විෂ ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥ මහත්තුරු මේ ලෝකයේ ඉන්නවා. මේ ලංකාවටම මේ පසුගිය වසර පහකට කලින් සාමාන්‍ය වෛද්‍ය විද්‍යාව හදාරලා උපාධිය අර ගත්තාට පස්සේ ලංකාවේ තියෙනවා උපාධි ආයතනයක් පෝස්ට් ග්‍රැජුවර් ඉසිටොප් මෙඩිසින් පී.ජී.එම්.අයි. මේකේ තමයි එ උපාධි ටික දෙන්නේ. එතකොට එම්.එස්.ඒ. උපාධිය ගත්ත 14 දෙනෙක් මේ රටේ ඉන්නවා. පශ්චාත් උපාධිය කළා මේ වස විෂ පිළිබඳව. 14 දෙනෙක් මීට අවුරුදු පහකට කලින් කළා. ඒ 14 දෙනාගෙන් හතර දෙනෙක් පමණ දැන් මේ රට හැරලා ගිහිල්ලා තියෙනවා. දැන් දහ දෙනෙක් පමණ ඉන්නවා. දැන් පසුගිය දා 14 දෙනෙක් ආවා එළියට. එතකොට මේ අයට විශේෂඥ තනතුරු දෙන්න විදිහක් නෑ. මොකද රටේ තියෙනවා නීතියක් ඒ අය එම්.ඩී. උපාධිය ගන්න ඕනේ. ඒක කරන්න අර පී.ජී,එම්. ආයතනයේ ඒකට අවශ්‍ය කරන කරකියුලම් එක නෑ. ඒක හදලා දෙන්න කියලා කිව්වා. අවුරුදු හයක් මේක හදනවා. ඒක කරන්න බැරි නම් මේ අය ඕස්ට්‍රේලියාවේ,ඉන්දියාවේ හෝ වෙනත් රටකට ඇරලා මේ එම්.ඩී.උපාධිය අරගෙන මේ අය මේ රටට ගෙනල්ලා එක දිස්ත්‍රික්කයකට එක විෂ වෛද්‍යවරයෙක් හෝ ලබා දුන්නොත් මේ දිස්ත්‍රික්ක 25 ට 25 දෙනෙක් හෝ ලබා දුන්නොත් අඩුම ගානේ අඩුම තරමේ මේ ලොකු තත්ත්වය සමනය කරන්න ලොකු උදව්වක් වෙයි. ඉතිං මේ යෝජනාව අපේ ගරු සභාපතිතුමාගේ ඉල්ලීමක් කරනවා සෞඛ්‍ය ඇමතිතුමාට මේක ලියලා යවන්න. එතුමා දන්නේ නැතුව ඇති. වර්තමාන ජනාධිපතිතුමා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ සෞඛ්‍ය ඇමති වෙලා ඉන්න කාලයේ මේ පිළිබඳව සාකච්ඡා කරලා මෙන්න මේ කටයුත්ත කරන්න කියලා කිව්වත් තාම මේ දේ සිද්ධ වෙලා නෑ. මේක කාගේ කාගේ වැරැද්දද කියලා මම දන්නේ නෑ. කාටවත් දෝෂාරෝපණය කරනවා නෙමෙයි. දැන් විෂ වෛද්‍යවරු හැටියට වැඩ කරන්නේ විශේෂඥ වෛද්‍යවරු කායික රෝගී විශේෂඥ මහත්තුරු. නමුත් ඒ අය කරන ක්‍රියාවලියට අපි ස්තූතිවන්ත වෙන්න ඕනේ. එහෙම කෙනෙක් නැතුව තිබ්බත් මේ කට්ටිය මේක ඇදගෙන ගිය එක ගැන. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා මේ කාලීන ඉතා වැදගත් මේ රටවල් දියුණු වෙන කොට මේ රටවල්වල ඇති වෙන විශාල නස්පැත්තිය බේර ගන්න මෙන්න මේ කටයුත්ත අපි ඒ මහ ආණ්ඩුවත් දැනුවත් කරලා මේ කටයුත්ත කරන්න කියලා ඉල්ලීමත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***

*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තූතියි වෛද්‍ය පරාක්‍රම අතාවුද ගරු මන්ත්‍රීතුමාට. මීළඟට යෙහෙයියා එම්.ඉෆ්ලාර් මැතිතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*

-------------------------------------------

ගරු සභාපතිතුමනි ප්‍රථමයෙන්ම වර්තමාන රජයේ වැඩපිළිවෙලක් අනුව වර්තමාන ජනාධිපතිතුමන් අග්‍රාමාත්‍යතුමන් ඒවගේම වර්තමාන කෘෂිකර්ම ඇමතිතුමාගේ අදහසක් වන වස විෂ වලින් තොර ආහාර නිෂ්පාදනය කිරීමේ වැඩ සටහනේ කෘෂිකාර්මික සතිය ප්‍රකාශයට පත් කරලා තියෙන ආරම්භ කරලා තියෙන මොහොතේ මේ සභා වේ මේ යෝජනාව ගෙන ඒමත් කාලීන අවශ්‍යතාවයක් සහ ඒවගේම ඉතාමත් වැදගත් අපේ රටට මේ වර්තමාන රජය හිතනවා වගේම මේ පළාත් සභාවත් කල්පනා කරමින් මේ අදහස ගෙන ඒම පිළිබඳව සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාට ස්තූති කරමින් ඒවගේම ඒවගේම මේ යෝජනාව ස්ථිර කරමින් මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන අතුලේ රත්න ස්වාමීන් වහන්සේගේ යෝජනාවක් අනුව ඉතාමත් වැදගත් අපේ රටේ බහුතරයක් මේ පරිච්ජේදය තුළ අපි මොන තරම් කෘෂිකාර්මික රටක් බවට ප්‍රකාශයට පත් කළත් අපේ රටේ එදා කෘෂිකාර්මික රටක් වශයෙන් තිබුණත් අද ටික ටික කාර්මික යුගයකට ආර්ථික වාසි තකා මේ රට නිර්මාණය වෙමින් යන මොහොතක තමයි

මෙවැනි යෝජනාවක් අද නැවත ආපස්සට හැරිලා බලන මොහොතක අපි ඉන්නේ

කොතනද කියලා තේරුම් ගන්න යුගයක තමයි අපි මේ කතා කරන්නේ ගරු සභාපතිතුමනි. මේ කතාව දිහා බැලුවහම මේ මාතෘකාව අපි සියළු දෙනාටම වැදගත් වෙනවා මොකද වස විෂ වලින් තොර ආහාර භාවිතය ප්‍රචලිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම වර්තමානයේ ක්‍රියාත්මක වෙන ඉතා යහපත් වැඩ සටහනකි. වර්තමාන රජය ගරු සභාපතිතුමනි මේ වැඩ සටහන ගේන්න එක හේතුවක් තමයි මට ඉස්සෙල්ලා කතා කරපු අපේ අතාවුද මන්ත්‍රීතුමා කියපු විදිහට මේක කෘෂිකර්මයට පමණක් දිග ඇරලා කියන්න බෑ. අනිත් පැත්තෙන් අපේ සෞඛ්‍යට පමණක් කියන්නට බෑ. මේක අනිත් පැත්තෙන් ගත්තහම අධ්‍යාපනය ,සෞඛ්‍ය ,කෘෂිකර්මාන්තය මේ ආයතන තුනම ඒකාබද්ධ වෙලා මේ රට ගැන අනාගතය ගැන හිතන අනාගත මේ උපදින සහ වර්තමානයේ ඉන්න ජනතාව ගැන හිතලා තමයි මේක ක්‍රියාත්මක විය යුත්තේ. මේ ආයතන දිහා බැලුවහම ඇත්තටම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒවගේම අපේ පළාත් සභාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය මේ සියල්ල ඒකාබද්ධ වෙලා තමයි මේ කටයුත්ත ක්‍රියාත්මක කළ යුත්තේ. ඒවගේම අපි දන්නවා කවුරුත් අපිට විජාතික සමාගම් ඇවිල්ලා එදා ඒ අය වස විෂ වලින් තමයි අපිට ලබා දුන්නේ. අපි කවුරු කොහොම කිව්වත් එදා සම්ප්‍රදායික ගොවිතැන් වලින් ඈත් වෙලා කෙටි කාලීන ලාභ ප්‍රයෝජනය සඳහා ඒවගේම ආර්ථික වාසි තකා තමයි ඒ අය පුරුදු වුණේ. දැන් ටික ටික යන කොට මේක විෂබීජයක් මේක අපිට අහිතකරයි කියලා තේරුම් ගන්න කොට අපි පස්සට ගිහිල්ලා වැඩියි. ඒ කොහොම වුණත් ඒක තේරුම් අරගෙන අවබෝධ කරගෙන දැන් හරි මේක නවත්තලා ආර්ථික වාසි වලට වඩා එදා කෘෂිකර්මාන්තයෙන් කළේ වෙන හේතුවක් නෙමෙයි තමන්ට පරිභෝජනය

කරන්න. ඉස්සර මට මතකයි ගොවිතැන් කරන කොට හැමෝම කියන්නේ කොච්චර ආවත් අපේ ගෙදරට පොල්

සම්බෝලයි බතුයි දීලා ඕන තරම් අපිට සලකන්න පුළුවන් යුගයක් එදා තිබුණා. අද ගොවිතැන කරන්නේ ඇයි. අද ගොවිතැන කරන්නේ තමන්ගේ වෘත්තියක් විදිහට. ආර්ථික වාසි තකා. ඒවගේම වැඩි ලාභ ප්‍රයෝජනය සඳහා. මේ සියල්ලම සිදු කරන්නේ මොකද අනාගතය තකා බහුතර ජනතාවට කරන හානියක්. මට ඉස්සෙල්ලා කතා කරපු අපේ ආතාවුද මැතිතුමා කියාපු විදිහට අපි කවුරුත් තමන්ගේ දරුවාට වෙනම හදනවා. නමුත් තමන්ගේ දරුවාට හොඳ ආහාර වේලක් දෙන කොට අන් අයට අලෙවි කරන කොට ආර්ථික වාසි ලබා ගන්න කොට වස විෂ වලින් තමයි ඔහු ඒ බලාපොරොත්තු වෙන්නේ. මොකද ආරථික වාසි තකා මේ රට නිර්මාණය වෙනවා. අපි ඒ නිර්මාණය ආගමානුකූලව හදවතින්ම බැලුවොත් ඒක වැරදියි. අපේ ආගම හැටියට නම් පැහැදිලිවම කිව්වොත් අසාධාරණ විදිහට හෙව්වොත් අසාධාරණ විදිහටමයි යන්නේ. රුපියලක් අඩුම ගානේ සාධාරණ විදිහට හෙවුවොත් ඒ රුපියල ඉතුරු වෙනවා. අසාධාරණ විදිහට කෝටියක් හෙව්වත් මතක තියා ගන්න ඒ කොටිය මදි වෙනවා. එක ලෙඩක් හැදුණොත් බෙහෙත් කරන්න ගියොත්.

මෙන්න මේක තමයි මේ වෙනස. අපි කවුරු හරි තේරුම් අරගෙන, දැන් මේ දේ අවබෝධ කරගෙන මේ කටයුත්ත කිරීම ඉතාමත්ම වැදගත්. රසායනික පොහොර භාවිතා කිරීමෙන් අපි ඉවත් වෙන්න ඕන. අපි ඇත්තටම කිව්වාම අපි පැහැදිලිවම සම්ප්‍රදායික දේවල් ආරක්ෂා කරගනිමින් නැවතත් ඉදිරියට ගෙනිහිල්ලා අපේ මේ ගොවියා ආරක්ෂා කරගෙන, ගොවියා රජකමටත් සුදුසුයි කියපු එක නැවතත් අපි ඒ ක්‍රමයට ගෙන එන යුගයක් මේ රටේ නිර්මාණය කළයුතුයි. ගොවියා නිසා තමයි

අපි ආහාර වේලක් අරගෙන හරි ජීවත් වෙන්නේ. මනුස්සයා ජීවත් වෙන්න නම් ඔහුට ආහාර අවශ්‍යයි. එය නිෂ්පාදය කරන්නේ ගොවියා නම් ගොවියා එදා වටිනාකමක් දුන්නා වගේම නැවත වටිනාකමක් අපි ලබාදිය යුතුයි. ඔහුගේ භාණ්ඩ අළෙවිය සහ ඔහුගේ නිෂ්පාදනය පැහැදිලිවම ඉතාමත් හොඳ ගුණාත්මක සමාජයට වැදගත් , ශරීරයට සුදුසු ආහාර වේලක් ගැනීමේ ශක්තිය ඇති කිරීම අපි ප්‍රචලිත කළයුතුයි. ඒක කරන්න පුළුවන් ගරු සභාපතිතුමනි, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා පැහැදිලිවම කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා මේක සෑහෙන්න ව්‍යාප්ත කරගෙන යන්න පුළුවන්. ඒ වගේම පැළ බෙදා දීම, ඒ වගේම විවිධ උපදේශනාත්මක සේවාවන් ඇති කිරීම, ජනතාව දැනුවත් කිරීම හරහා මේක ක්‍රියාත්මක කරන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අධ්‍යාපන වගේම සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා මේ සඳහා වැඩ පිළිවෙල ඇති කරන්න පුළුවන්. ඒ නිසා අපේ ශරීර සෞඛ්‍ය පිරිහෙලා තියෙන්නේ ඇයි ? රෝගීන් වැඩි වෙලා තියෙන්නේ මොකද ? අපේ රටේ ගත්තාම 50% ක් ඉන්නේ අද බෝ නොවන රෝග නිසා. අද පැහැදිලිවම කවුරු මොනවා කිව්වත් අද අපේ රටේ ලෙඩ්ඩු ඉන්නේ බෝ වන රෝග නෙමෙයි, බෝ නොවන රෝග නිසා. මෙවැනි ආහාර පාන ගැනීම නිසා කියන එක අපි තේරුම් ගන්න ඕන. ඒ නිසා ඉතාමත්ම වැදගත් මේ යෝජනාව. ඒක අපි ක්‍රියාත්මක කිරීමට වර්තමාන රජය සැදී පැහැදී සිටිනවා ක්‍රියාත්මක කරන්න. පහුගිය කාලයේ මොන දේ වුවත් දැන් හරි අපේ තේරුම් අරගෙන, අවබෝධ කරගෙන ඉදිරි අනාගතය සාර්ථක කරගෙන, මේ වර්තමාන රජය ගැන ඔබතුමා බලාගෙන ඉන්න මේ මොහොතේ ඔබතුමාම කල්පනා කරලා, ඔබතුමාට යහපතක් වෙයි. මේ රජයට ඉදිරි කාලයේ සාර්ථකව මුහුණ දීලා, ඒ සියල්ල ක්‍රියාත්මක කිරීම තුළින් රටේ සමාජයට, අනාගතයට යහපත් ජීවිතයක් ගත කිරීමට

සියළුදෙනාට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබිලා, ඒ වගේම දුකෙන් තොර, සැපෙන් බර නිරෝගීමත් ජීවිතයක් ගත කිරීමේ වාසනාව සියළුදෙනාට හිමිවේවා කියලා

ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට. මීළඟට රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා අපේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමාගේ කථාව ඉවර වෙනකොටම මම කථාව දීම ගැන. මොකද උත්තර දෙන්න තියන ඒවා කියවුනේ එතුමාගෙන්මයි. මම බොහොම සන්තෝෂ වෙනවා මේ ගරු සභාවට අපේ සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම වටිනා, ඉතාම වැදගත්, ඉතාම කාලෝචිත යෝජනාවක්. මේ කාරණාව පිළිබඳ මට මතකයි මේ පළාත් සභාවට මම ආවාට පස්සේ දෙවෙනි අවුරුද්දේ මගේ පළාත් සභාවේ දෙවෙනි අවුරුද්දේ මගෙ බිම කියලා ව්‍යාපෘතියක් අරගෙන ඇවිල්ලා වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය පිළිබඳව සබරගමුව පළාත තුළ ගොවි පවුල් 12,000 කට අවශ්‍ය උපකරණ දෙන්න වැඩ පිළිවෙලක් ආරම්භ කළා. මම හිතන්නේ උඩ ඉන්නවා අපේ කෘෂිකර්ම පළාත් අධ්‍යක්ෂතුමා එහෙම. විශාල සහයෝගයක් මේකට දුන්නා. මම හිතන්නේ විශේෂයෙන් මතක් කරන්න ඕන මහීපාල හේරත් ප්‍රධාන අමාත්‍යතුමා. ඒ වගේම අපේ ප්‍රධාන ලේකම්තුමා ගිහිල්ලා ඉතාම හොඳ වැඩ සටහනක් මගෙ බිම. එහෙම නැත්නම් මනරම් ගෙවතු බිහි කිරීමට මගපෙන්වීම කියන වැඩ සටහන අති සාර්ථකව අපි ක්‍රියාත්මක කරලා, අදටත් වස විසෙන් තොර ආහාර ඒ ව්‍යාපෘතිය හරහා ආරම්භ වෙලා අදටත් අපේ ප්‍රදේශවල දැනටත් බිහි වෙනවා.

ඒ නිසා සලිත මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව මම අගය කරන්නේ අපි සියළුදෙනාම තේරුම් ගතයුතු මේ කාරණාව අමතක වේගන යනකොට නැවත මතක් කරමින්, නැවත නැවත මතක් කරමින් ඒ සඳහා අළුතෙන් ක්‍රියාත්මක කළයුතු වැඩ පිළිවෙලවල් යෝජනා කරමින් මේ වගේ යෝජනා ගේන එක අපි ඉතාම ඉහළින් අගය කරනවා. ඒ නිසා මම විශේෂයෙන් මතක් කරන්න ඕන මේ හැම ගෙවත්තකම එළවළු, පළතුරු සිටුවීම තමයි මේකේ අපේ තියන මූලිකව ඉලක්කය. ඒ වගේම ඒ හදන එළවළු, පළතුරු කාබනික පොහොර භාවිතා කරලා , රසායනික පොහොර අවම කරලා, විෂ නැති ආහාර විදිහට අරගන්න එක තමයි මේකේ තියන ඉලක්කය. අපි ඉතිහාසය ගත්තාම ඉතිහාසයේ දසමහා යෝධයෝ හිටියා කියලා කියනවා. පරණ තැන් බලන්න ගිහාම මහා විශාල ගල් පෙරලපු ඒවා තියනවා. මේවා දිහා බැලුවාම මේ යෝධයෝ කරපු වැඩ ඉතිහාසයේ කළේ අපි වගේ අපේ අතීතයේ හිටපු මිනිස්සු කියන එක අපට ඉතිහාසය විග්‍රහ කරලා බලනකොට, ඉතිහාසය බලනකොට අපට පැහැදිලි වෙනවා. හැබැයි ඒ වැඩ ඒ අයට කරන්න පුළුවන් වුනේ මේ වස විසෙන් තොර ආහාර පාවිච්චි කරපු පිරිසක් නිසා තමයි, නිවැරදි ආහාර ප්‍රතිපත්තියක් තිබුණ අය ඒ විදිහට වැඩ කරපු නිසා තමයි ඒ වගේ වැඩ කරන්න පුළුවන් පිරිසක් බවට පත් වුනේ. ගරු සභාපතිතුමනි, මේක ඉස්සෙල්ලාම දැක්කේ, මේ කාරණාව පිළිබඳව අපේ අවධානය යොමු කළයුතුයි කියලා රටක නායකයෙක් ඉස්සෙල්ලාම

දැක්කේ හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමා මේක දැකලා මේ සඳහා දිවිනැගුම කියන වැඩ සටහන අපේ රටට අරගෙන ඇවිල්ලා එතුමා අපේ රටේ බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා හැම ගෙදරකටම එළවළු බීජ පැකට් එකක් දීලා, ඒ අවශ්‍ය අනෙකුත් පහසුකම් ටික දීලා කාබනික පොහොර වැඩ සටහන් හඳලා, ලංකාවේ හැම ගෙවත්තක්ම වස විසෙන් තොර පළතුරක්, එළවළුවක් තියන ගෙවත්තක් බවට එතුමා පරිවර්තනය කළා. ඒ කරපු වැඩ පිළිවෙල ඉස්සරහාට ගිය නිසා තමයි ඒ කාලයේ ආපු ලෝක ආහාර අර්බුදයේ දී අපේ ලංකාවට එවැනි තත්ත්වයට මුහුණ දෙන්න නොදී, ඒකට මුහුණ දිය හැකි මට්ටමක අපේ ලංකාව තිබුනේ එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා අරගෙන ආපු ඒ වැඩ පිළිවෙල හින්දා. අපේ වෛද්‍ය පරාක්‍රම අතාවුද මැතිතුමා එතුමාගේ කථාවේ දීත් කිව්වා මේ ගැන. ඒ නිසා ඒ ගෙනාපු වැඩ පිළිවෙල තමයි මේ යන්නේ. අපේ ඉෆ්ලාර් මැතිතුමා කියනවා මේ වර්තමාන රජයේ වැඩ පිළිවෙලලු, අතිගරු ජනාධිපතිතුමයි, අගමැතිතුමයි ගෙනාපු. බම්බුව තමයි. අපි දන්නවා මේ අනුන්ගේ ළමයින්ට උප්පැන්න ලියන්න බොහොම දක්ෂ කට්ටියක් ඉන්නවා.

අපේ ගෙවල් පැත්තේ එක ගෙදරක නෝනාට බබා හම්බ වෙන්න ඉන්නැද්දී මහත්තයා රට ගියා. ඊට පස්සේ මහත්තයා රට ගිහිල්ලා ආපහු එනකොට නෝනාට ළමයා හම්බ වෙලා අල්ලපු ගෙදර එකා උප්පැන්නේ ලියලා. මිනිහා පැනලා ගිහිල්ලා අර ගෑණිත් එක්ක. ඒ නිසා එහෙම වැඩ කරන කට්ටිය පළාත් සභාවෙත් ඉන්නවා. මහ ආණ්ඩුවෙත් ඉන්නවා. හැබැයි එකක් මතක තියාගන්න. මළේ නෑ.

රට ඇරලා ගියේ නෑ. ආපහු සැරයක් මේ බිමට ඒ තාත්තා එනවා කියන එක විතරක් මතක තියාගන්න කියලා අපි තමුන්නාන්සේලාට මතක් කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි,

***ගරු මන්ත්‍රී අජිත් කුමාර***
***கௌரவ உறுப்பினர் அஜித் குமார***
*Hon.Member Ajith Kumara*

---

ඔබතුමා කියන විදිහට එහෙම නම් ඒ ප්‍රශ්නෙ විසඳිලා තියෙන්න එපායැ.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

මේක මේ තමුන්නාන්සේලා කියන විදිහට සම්පූර්ණයෙන් එහෙම ඉවර කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. මේකේ අර අපේ වෛද්‍ය පරාක්‍රම අතාවුද මැතිතුමා කිව්වා මේකේ තියන විවිධ පැතිකඩවල් එතුමා පෙන්නලා දුන්නා. සලිත මන්ත්‍රීතුමාත් පෙන්නලා දුන්නා මේකේ විවිධ පැතිකඩවල්. මේකේ එක එක පැතිවලට විකාශනය වෙච්ච කාරණා ගණනාවක් එකතු වුන සංකීර්ණ කාරණාවක්. මේක එක පාරට අත හේදුවා වගේ එක පාරට ඉවර කරන්න පුළුවන් ප්‍රශ්නයක් නෙමෙයි. ඔබතුමාත් කිව්වා එක පැත්තකින් සෞඛ්‍ය පැත්ත. අනෙක් පැත්තෙන් කෘෂිකර්ම පැත්ත. මේ වගේ විවිධ පැතිකඩවල් ඔස්සේ මේ ගැන බලන්න වෙනවා. හැම පැතිකඩක්ම මේකට ගලපන්න ඕන. එහෙම නැතුව මේ ප්‍රශ්නයට උත්තර හොයන්න බෑ. ඒ නිසා තමයි ඒ සඳහා වූ මූලික වැඩ පිළිවෙල ආරම්භ කරලා ඒ සඳහා අවශ්‍ය කාරණා ටික කළේ. එහෙම නම් අදටත් මේක ක්‍රියාත්මකයි. තමුන්නාන්සේලා මම දන්නේ නෑ දන්නවාද

? නැද්ද ? කියලා , ඊයෙ පෙරෙයිදා උත්සවවලට ගියා. අපේ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා අපේ එතුමා ගිහිල්ලා, එතුමා මැදිහත් වෙලා ඇමතිතුමාගේ උපදෙස් පරිදි ඉතා ලස්සන වැඩ පිළිවෙලක් කරගෙන යනවා මේ දවස්වලත්. ඒ ගම්වල ඉන්න ගෙවිලියන්ට, ගොවියන්ට අවශ්‍ය උපකරණ ටික දීලා, අවශ්‍ය කාබනික පොහොර ටික දීලා, ඒගොල්ලෝ එකතු කරලා, ඒගොල්ලෝ හරහා මේවා වෙළඳපොළට ගේන මට්ටම හදලා, ගෙදර ආර්ථිකයත් ඒ හරහා වර්ධනය කරන ලොකු වැඩ පිළිවෙලක් අපේ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වෙනවා. මේවා දන්නේ නැතුව ඔබතුමන්ලා කථා කරනවා ද කියලා මම දන්නෙ නෑ. ඒ නිසා මේ ක්‍රියාත්මක වෙන්නේ එදා අර ආරම්භ කරලා ඉස්සරහාට අරගෙන ආපු වැඩ පිළිවෙල. නැතුව වෙන මොකක්වත් නෙමෙයි.

ඒ නිසා මේවා සම්බන්ධයෙන් කථා කරනකොට විශේෂයෙන් මට මතක් වුනා මගේ ජීවිතයේ ලබපු එක අත්දැකීමක් කියන්න. මේක අපි දවසක් නුවරඑළියේ ගිහිල්ලා අපේ ගෙදර කට්ටිය ඉන්නකොට තියනවා ගරු සභාපතිතුමනි, ලස්සන ලීක්ස් වගාවක්. මම කථා කරලා කිව්වා මේ ලීක්ස් ටිකක් අපට ගලවලා දෙන්න කියලා හොඳ අළුත් ලීක්ස් ටිකක් ගෙදර ගේන්න හිතාගෙන. ඒ පාර ඒ ගොවි මහත්මයා කිව්වා ඕක දෙන්න බෑ මහත්මයා මේ දවස් දෙකකට ඉස්සෙල්ලා බෙහෙත් ගැහුවේ කියලා. ඊට පස්සේ මම වැඩේ අතඇරලා ඉන්නකොට ආපහු කියනවා කැරට් ටිකක් දෙන්නද කියලා. මම ඇහුවා කැරට් කොහේද තියෙන්නේ කියලා. සර්, අර ලීක්ස් ගස් ටික මැද්දේ තියෙන්නෙ කැරට් කිව්වා. මම ඇහුවා එතකොට දවස් දෙකකට ඉස්සෙල්ලා බෙහෙත් ගහපු නිසා ලීක්ස් දෙන්න බැරි නම් කැරට් දෙන්නෙ කොහොමද කියලා, ඒ පාත්තියේම තියන. ඒක සර්, යටටනේ බහින්නේ අලේ. ලීක්ස් ගහ උඩනේ තියෙන්නේ. ඒක හින්දා ප්‍රශ්නයක් නෑ කිව්වා. අපි හොඳට අරගෙන ඇවිල්ලා, රසයි කියලා, ගුණයි කියලා හිතාගෙන, එළවළු කන්න ඕන කියලා හිතාගෙන අපි කන්නෙ වස කියන එක අපට පැහැදිලි වුනා ඒ වෙලාවේ. ඒ නිසා තමයි අපි හැමදාම කියන්නේ වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය ගෙවත්තේම එළවළු ටික, පළතුරු ටික අපිම හදාගන්න තැනට වැඩ කරන්න ඕන කියලා. ඒ නිසා තමයි සලිත මන්ත්‍රීතුමාගේ යෝජනාවට අපි මෙච්චර අවශ්‍ය සහයෝගය දීලා කථා කරන්නේ.

ඊළඟට මේකේ තවත් පැතිකඩවල් තියනවා. දැන් අර පොල්තෙල් භාවිතය පිළිබඳ අපේ ඩොක්ටර් කිව්වා. ආපහු කිව්වා මේ රත්නපුරේම අපේ මෙතන අර එක වෙළඳ සැළක තියනවා පිරිසිදු සුදු පොල්තෙල්. කොලෙස්ට්‍රෝල්වලට ගුණයි කියලා මේක දෙන්නේ. එතකොට කොලෙස්ට්‍රෝල් හැදෙන්නත් මේක බලපානවා කියලා කියනවා. මේක ගුණයි කියලත් කියනවා. ඊළඟට සීනිවලට ගුණයි කියලා නිවුඩ්ඩ තියන හාල් ගන්න කියනවා. අපේ සලිත මන්ත්‍රීතුමා පැහැදිලි කරලා පෙන්නුවා ඒ අර රතු නාඩුවල නිවුඩ්ඩේ තියන හානිය. ඊළඟට තව වෛද්‍යවරයෙක් කියනවා මේවා වකුගඩුවලට හොඳ නෑ කියලා. සීනිවලට හොඳයි කියනවා. වකුගඩුවලට හොඳ නෑ කියනවා. සීනි තියන ලෙඩාට මේක කන්නේ මොකක්ද කියලා හිතාගන්න බෑ. ඒ නිසා මේකෙදී අපට තියනවා වැදගත්ම කාරණාවක්. මම මේ නිකම් කීපයක් විතරයි කිව්වේ. ජනතාව ලෙඩක් හැදුනාම මේ ලෙඩේට බෙහෙත් ගන්න යනවා වඩා ඒ ලෙඩේ හැදුන අයගේ එක එක පුරුදු පාවිච්චි කරනවා. මේවා කැවොත් වැඩි වෙනවා. මේවා කැවොත් වැඩි වෙනවා. මේවා අඩුවෙන් කන්න. මේවා වැඩියෙන් කන්න කියලා යාළුවෝ කියන ඒවා කනවා. එහෙම ආහාර අරගෙන

අවසානයේ ලොකු විනාශයක් කරගන්නවා. ඒ නිසා නිවැරදි ආහාර පුරුදු පිළිබඳව සමාජය දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරන්න වෙනවා.

ඊළඟට මම හිතනවා මේ කාලය ගත්තා වැඩියි වගේ. ඒ නිසා මම අවසාන වශයෙන් එක යෝජනාවක් මේකට එකතු කරනවා. අර අපේ සලිත මන්ත්‍රීතුමා කිව්වා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු හරහා මේක පාලනය කිරීමේ වැඩ පිළිවෙලක් කරන්න ඕන වගේම අපේ ඒ.අයි. මහත්වරු එහෙම නැත්නම් කෘෂිකර්ම උපදේශක මහත්වරු හරහා දැනට ක්‍රියාත්මක වෙන වැඩ පිළිවෙල තවත් විධිමත් කරලා, ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් ඒකට එකතු කරලා, ඒගොල්ලන්ට අවශ්‍ය කරන පහසුකම් වැඩි කරලා මේ වැඩ සටහන ඒ.අයි.මහත්වරුත් සම්බන්ධ කරගන්න ඕන මීට වඩා පුළුල් ලෙස ව්‍යාප්ත කර ගැනීම සඳහා. ඒ නිසා මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. අපේ ඉෆ්ලාර් මන්ත්‍රීතුමා දෙවියනේ කියලා තමුන්ගේම ළමයෙකුට උප්පැන්නය ලියන්න වාසනවා උදාවේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තූතියි ! රම්‍යකුමාර වීරසිංහ මන්ත්‍රීතුමාට. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි, සලිත කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වස විෂවලින් තොර ආහාර භාවිතය ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම වර්තමානයේ ක්‍රියාත්මක ඉතා යහපත් වැඩ සටහනකි. එම වැඩ සටහන සාර්ථක කර ගැනීමට වෙළඳපොළ පවතින එළවළු, පළතුරු ඇතුළු ආහාර ද්‍රව්‍ය කල් තබා ගැනීම, ඉදවීම සඳහා කෘෂි රසායනික වැනි අහිතකර දෑ භාවිතා කිරීම වැළැක්වීම හා පාලනය කිරීම කළයුතුය. ඒ වෙනුවෙන් සබරගමුව පළාත තුළ සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් යොදවාගෙන ඔවුනට අවශ්‍ය පහසුකම් ලබාදී ක්‍රමවත් වැඩ සටහනක් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

මේ යෝජනාව කාලෝචිතයි, ඉතා වැදගත්. මෙතුමා ගෙනාපු යෝජනාවලින් ඉතා වැදගත්, කාලෝචිතම යෝජනාව අද තමුන්නාන්සේ ගෙනාවේ කියන එක මම ප්‍රකාශ කරනවා. හැබැයි මේක මෙහෙම වෙන්න ඕන. සබරගමුව පළාත. නෑ, මේ පුංචි දූපත ශ්‍රී ලංකාව. මේකේ පළාත් නවයයි. මේක ගරු සභාපතිතුමනි, මුළු රටටම බලපාන ආකාරයට කෙරෙන්න ඕන. මේ යෝජනාව අද ගත්තාම අද පවතින වස විස භාවිතය තුළ මුළු ලෝකයටම වැදගත් යෝජනාවක්. මේ යෝජනාව ඉතා වැදගත්. අපේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා 2015 ජනවාරි 08 වෙනිදාට පස්සේ සතියක් යනකොට මේ යෝජනාව සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු වුනා. ඒ තුළින් ගත්තාම අද විශේෂයෙන්ම මධ්‍යම පළාත, ඌව පළාත, සබරගමුව පළාත මී උණෙන් මැරෙන සංඛ්‍යාව ගරු සභාපතිතුමනි, අඩු වෙලා තියනවා. අපට

දැන් කාලයකින් අහන්න සිද්ධ වෙන්නේ. පහුගිය කාලයේ ඔබතුමාට මතක ඇති මී උණ, මී උණ, මී උණ. අහිංසක ගොවියා ඉස්සර කුඹුරට බහිනකොට උදේ 7.00 ට බැස්සා නම් හවස 5.00 ට, 6.00 ට තමයි කුඹුරෙන් ගොඩ එන්නේ ගරු සභාපතිතුමනි. වැස්සට තෙමිලා. අව්වට වේලිලා. ඒ

ගොවියාට උණක් ගැනුනාම අත පය රිදෙනකොට ගොවියා ගෙදර ගිහිල්ලා වෙනිවැල්ගැට කැල්ලක් දාලා, කොත්තමල්ලි ටිකක් දාලා, ඉඟුරු කැල්ලක් දාලා තම්බලා බීලා පහුවදා උදේ වැඩට එනවා. එහෙම නෙමෙයි පහුගිය කාලයේ සිද්ධ වුනේ. මේ රටේ වුනේ යන්තම් කකුලේ කුඩුහම කැඩිලා නම්, අර විස බෙහෙත් කුඹුරට ගහල පල්වෙන්න දාන එක , තණකොල මැරෙන්න ගහන බෙහෙත අර කුඩුහම දිගේ ශරීරගත වෙලා හවසට ගෙදර ගිහාම උණ ගැනුනාම ගානකට ගන්නෙ නෑ. ඉස්සර අපට උණ ගැනුනත් සනීප වෙනවා, කොත්තමල්ලි ටිකක් බිව්වාම. අර කොත්තමල්ලිවලට දාන වෙනිවැල්ගැටවල ඖෂධයක් නිසා අර පුද්ගලයාට ඇගේ පතේ අමාරුව අඩු වුනත් ගරු සභාපතිතුමනි, ඇඟ ඇතුලේ තියන විස ගියේ නෑ. දවස් තුනයි, හතරයි, පස්වෙනි දවසේ ඉස්පිරිතාලෙදීම මේ පුද්ගලයා මැරෙනවා. මැරුනාම කියනවා මී උණ කියලා. ඒ විස බෙහෙත්වලින් තමයි ඒ දේ සිද්ධ වුනේ. අද ගත්තාම බහුලව පවතිනවා මට නම් පළතුරු කඩේකට ගිහාම දත් කැවෙනවා මට. කිසිම දෙයක් නෑ ගරු සභාපතිතුමනි, වස විස වලින් තොර පළතුරක් කන්න. වී ගොවිතැනත් එකයි. පළතුරු ගොවිතැනත් එකයි. මේ හැම දෙයක්ම ගත්තාම අපි මේ සබරගමුව පළාත් සභාවේ ගරු සභාපතිතුමා වශයෙන් තමුන්නාන්සේ මේ ඉතා කාලෝචිත වැදගත් යෝජනාව නැවත වරක් මතක් කිරීමක් වශයෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් ලියන්න ඕනෑ මේ සබරගමුව පළාත් සභාවේ මේ වගේ යෝජනාවක් ගෙනාවා කියලා. මේක ඉතා වැදගත්. මේ වසෙන් විසෙන් මැරෙන ජනගහණය ගත්තාම අති විශාලයි. අපේ

ඉල්ලාර් මන්ත්‍රීතුමා කියාපු ආකාරයට ගරු සභාපතිතුමනි, මේක නවත්වන්න තියන එකම ක්‍රමය මේකයි ගරු සභාපතිතුමනි. මේක නැතුව කවදාවත් මේක නවත්වන්න බෑ. විස වස කැවෙන එක නවත්වන්න බෑ. විනාශ වෙන එක නවත්වන්න බෑ. මිනිස්සුන්ට වෙන හානිය නවත්වන්න බෑ. මිරිස් කුඩු ගන්න. ගඩොල් කුඩු දානවා. කහ කුඩු ගන්න. ඒකටත් මොනවා හරි කලවම් කරනවා. තුනපහ ගන්න. ඒකටත් දානවා. ඊටත් වැඩිය විස දෙයක් තමයි ගරු සභාපතිතුමනි, අජිනමොටෝ. මට හොඳට මතකයි 1994 ට ඉස්සෙල්ලා අජිනමොටෝ තියන කඩ හොයලා දඩ ගැහුවා. අද විශේෂයෙන්ම කොළඹ නෙමෙයි, නගරයේ නෙමෙයි......

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

---

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. ගනපූරණය නෑ සභාවේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ඔබතුමා කථාව නවත්වන්න. ගනපූරණය හඳාගන්න සීනුව නාද කරන්න.

**(කැඳවීමේ සීනුව නාද කරන ලදී)**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

හොඳයි සිරිපාල මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

මට මේ ගනපූරණය ගැනත් පොඩ්ඩක් කථා කරන්න ඕන ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------

දැන් කථාව කරන්න. දැන් තමුන්නාන්සේලාම කාලය ඕනෑ කියලා කලින් අවසන් කරන්න තියෙද්දී තමුන්නාන්සේලාම තමයි ඇද්දේ. තමුන්නාන්සේලාගේ සාමූහිකත්වය බලන්න හොඳේ. අවශ්‍යතාවය නිසා ගනපූරණය තියාගෙන වැඩ අවසන් කිරීමේ වගකීම තියෙන්නේ තමුන්නාන්සේලාට. ඒ නිසා ඕක ඉවර කරන්න ඉක්මණට.

දෙන්න ඕන. අජිනමොටෝ ගැන ගත්තොත් ගරු සභාපතිතුමනි, පෙර තිබුනේ නගරයට පමණයි මේක සීමා වෙලා. අද ගත්තාම ගොඩතරයේ කඩවල මෙහෙම ප්‍රසිද්ධියේ තියලා තියනවා අජිනමොටෝ තැටිය. කොත්තු රොටී කියනවා. තවත් මොනවාද කියනවා. මේවාට මේකෙන් හැන්දක් දාලා තමයි ගරු සභාපතිතුමනි, රස කරලා කන්න දෙන්නේ. කාපු ගමන් නාගසලන්. එක්කෝ වකුගඩු ඉවරයි. එහෙම නැත්නම් පිළිකාව. එහෙම නැත්නම් බඩ ඉස්සරහාට නෙරලා එනවා. විවිධ දේවල්. මේ රටේ වගකීමක් දරණ උදවිය ප්‍රාදේශීය සභාවේ වෙන්න පුළුවන්. පළාත් සභාවේ වෙන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ වෙන්න පුළුවන්. ජනාධිපති වෙන්න පුළුවන්. මේ රටේ බහුතරයක් නිරෝගීන් බවට පත් කරන්න නම් මේ ගැන දැඩි තීරණ ගන්න ඕන. දැඩි තීන්දු තීරණ අරගෙන මේ වගේ වස විස කවන අයට වෙනම දඩුවම් දෙන්න උසාවියක් හදන්න ඕන ගරු සභාපතිතුමනි. අපි කොපමණ කෑ ගැහුවත්, කොපමණ කථා කෙරුවත් අපි කඩයකට ගිහිල්ලා බැලුවාම මේ දේවල් නිබඳවම සිදුවෙන දේවල් ගරු සභාපතිතුමනි. ඒ නිසා මේකට විකල්පයක් වශයෙන් අපි කියන්නේ මේ යෝජනා සම්බන්ධව අද මේ පළාත් සභාවේ කථා කරපු, මේ පළාත් සභාවට පමණක් සීමා කරපු මේ යෝජනාව මුළු රටටම බලපාන ආකාරයට ජනාධිපතියි, අගමැතියි දැනුවත් කරලා වස විසෙන් තොර ආහාර වේලක් ජනතාවට ලබාදීමට වැඩ පිළිවෙලක් දියත් කරන්න කියමින්, මම එක දෙයක් කියලා නවත්වන්නම් ගරු සභාපතිතුමනි. වස විස නැතුව කාපු කාලයක් තිබුණා. ඒ කාලේ තමුන්නාන්සේලාටත් මතක ඇති.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------

මට මේක කථා කරන්න ගියොත් වෙලාව මදි. තමුන්නාන්සේලා සහයෝගය

දිවංගත ඩඩ්ලි සේනානායක මැතිතුමා කිව්වා මැතිවරණ පොරොන්දුවක් 1960 මට හොඳට මතකයි, මටත් අවුරුදු 11 යි වයස. අපි හාල් සේරුවක් දෙනවා කිව්වා නිකම් නොමිළේ. මැතිණී කිව්වා ඊහාවා රුස්වීමේ සිරිමාවෝ ඩයස් බණ්ඩාරනායක මැතිණිය මම හාල් සේරු දෙකක් දෙනවා කිව්වා. ඊහාවා රුස්වීමේ ඩඩ්ලි සේනානායක මහත්මයා ඇහුවා කොහොමද මැතිණී හාල්

සේරු දෙකක් දෙන්නේ ? මම හඳෙන් ගෙනල්ලා දෙනවා කිව්වා. හඳෙන් හාල් ගන්න 1960 ජනතාව ඡන්දය දීලා, විදේශ ආධාර නැති වෙනකොට 70 සමාවෙන්න. විදේශ ආධාර නැති වෙනකොට නියෝග කළා මඤ්ඤොක්කා වවන්න. පළතුරු වවන්න. එළවළු වවන්න. වී ගොවිතැන් කරන්න. විදේශ ආධාර නැති නිසා මේක උඩුදිව්වා වගේ වර්ධනය වුනා ගරු සභාපතිතුමනි. ගෙදර මල් පෝච්චියෙත් හැදුවේ පළතුරක්, එළවළුවක්. කුඹුරු වගා කෙරුවා. අද වගේ පොරොන්දු වුනේ නෑ. පරාක්‍රම යුගයේ කෝටි 5 කට වැඩිය ජනතාවක් කාලා, බීලා , ස්වයං පෝෂිත වෙලා පිටරට ඇරපු නැව් ගණන් හාල් අද දෙකොටි දස ලක්ෂයක් වෙලා අපි පිට රටට දත නියවන්න වෙලා තියනවා ගරු සභාපතිතුමනි. මේවයි අවධානයට ගන්න ඕන. එතකොට එදා මැතිණිය ගෙනාපු ඒ කාරණය ක්‍රියාත්මක වුනා නම් හරියට මේ වෙනකල් අර පරාක්‍රම යුගය හා සමානවම අපි කාලා බීලා නැව් ගණන් පිටරට අරින්න තිබ්බා ගරු සභාපතිතුමනි. මේක නායකයින්ගේ ඒ වගේම පාලකයින්ගේ තියන දුර්වලකමින් මේ රටේ ජනතාව දවසින් දවස මැරිලා යන එක නැවත වාරයක් කියනවා මම තමුන්නාන්සේට අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් දැනුවත් කරලා මේකට විකල්පයක් සොයා ගන්න කියමින් මේ යෝජනාව සම්බන්ධයෙන් සලිත කරුණාරත්න මන්ත්‍රීතුමාට නැවත වාරයක් ස්තුති කරමින් මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමනි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාට. ගරු සලිත කරුණාරත්න මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද 6/1/2016/17 දරණ යෝජනාව පිළිබඳව මෙම ගරු සභාවේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම මැති ඇමතිතුමන්ලා ඉතාම වැදගත් වූ, ඉතාම අත්‍යාවශ්‍ය වූ, ඉතාම වටිනා යෝජනා අදහද් ඉදිරිපත් කරමින් මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් වශයෙනුත් ඒ වගේම මෙහි තිබෙන වැදගත්කමත් පෙන්වා දෙන්න කටයුතු කළා. ඒ පිළිබඳව සභාවට ස්තුතිය ප්‍රකාශ කරමින් ඔබ සැම දෙනාගේම ඉල්ලීම පරිදි මේ කාරණාව තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමන්ලාගේ ඉල්ලීම පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දැනුම් දෙනවා.

**සභාව කල් තැබීමේ යෝජනාව :**

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

ගරු සභාපතිතුමනි, මෙම ගරු සභාව 2016 ඔක්තෝබර් 25 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

**සභාව කල් තබන අවස්ථාවේ යෝජනා :**

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.

***ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස***
***கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச***
*Hon.Opposition Leader W.Somadasa*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මට අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගෙන් ප්‍රශ්න දෙකක් අහන්න තියනවා. ඒකට ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා. අමාත්‍යතුමා මේ වෙනකොට සභාව තුළ නෑ. ඒ ගැන අපි කණගාටු වෙනවා. මේකට පිළිතුරු දෙන්න පුළුවන් වගකිවයුතු ඇමතිවරයෙක් මේ ස්ථානයේ නෑ. ඒ ගැන අපි කණගාටු වෙනවා. බාබුල් හසන් සෙනට්‍රල් විද්‍යාලය වරකාපොල. ගරු සභාපතිතුමනි, වරකාපොල ද්‍රවිඩ භාෂාව ඉගන ගන්න ඒ වගේ පාසල් හතරක් තියනවා. මේ පාසල් හතරේ ප්‍රධාන පාසල තමයි මේ බාබුල් හසන් සෙන්ට්‍රල් විද්‍යාලය. මේකේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 856 ක් අධ්‍යාපනය කරනවා. පන්ති සංඛ්‍යාව 31 ක් තියනවා. විදුහල්පති ඇතුළු ගුරු සංඛ්‍යාව 42 ක් ඉන්නවා. මේ වෙනකොට ඒකේ ගුරු මණ්ඩලයේ අට දෙනෙක් ගුරුවරු නෑ. කාලයක් තුළ විදුහල්පතිවරයා, ඒ වගේම ගුරු දෙගුරු සමිතියේ නිළධාරීන්, වගකිවයුතු ස්ථානවලින් ඉල්ලීම් කරනවා මේවා ලබාදෙන්න කියලා. මොකද මේ වෙනකොට ශිෂ්‍යත්ව විභාගය අවසන් වුනා. ඒ එක්කම ඉදිරියේ උසස්පෙළ, සාමාන්‍ය පෙළ විභාගවලට ළමයි ලියන්න ඕන. මේ අධ්‍යාපනය දෙන්න ඒ විෂයය භාර ගුරුවරු නෑ. ඉතින් මේක විශාල අසාධාරණයක් ඒ පාසලේ අධ්‍යාපනය ලබන දරුවන්ට. මේක ගැන දෙමව්පියන් බොහොම කණස්සල්ලෙන් ඉන්නේ. මේකට මේ අවස්ථාවේ පළාත් සභාවේ වගකිවයුතු ඇමතිවරුන්ට ලියලා ඉල්ලීම් කරලා තියනවා. මේ වනතුරු ලැබිලා නෑ. අපට පේන්නේ මේ පාසල වැහෙන්න අරිනවාද කියන එක තමයි අපට සැකයක් තියෙන්නේ. දෙමව්පියෝ ඇවිල්ලා අපට කථා කරනකොට අපට වැටහෙනවා මේ වගේ ඉල්ලීම් කරලත් මේ ගුරුවරු ලබාදෙන්නෙ නැත්නම් මේ දරුවන්ගේ අනාගතය මොකක්ද ? මේ දරුවෝ කෑගල්ල නගරයේ ද්‍රවිඩ පාසලට යවන්න ඕනැද ? එහෙම නැත්නම් මාවනැල්ලේ මුස්ලිම් පාසල්වලට යවන්න ඕනද ? මෙන්න මෙහෙම තත්ත්වයකට අද දෙමව්පියන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ දරුවන්ට වෙන අසාධාරණය නැති කරලා දෙන්න. මේ පාසලට ලැබිය යුතු හිඟ ගුරුවරු ප්‍රමාණය ලබාදෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

දෙවෙනි ප්‍රශ්නය තමයි ගරු සභාපතිතුමනි, රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ළඟම පාසල හොඳම පාසල හැටියට නම් කරලා පාසල් කෑගල්ල දිස්ත්‍රික්කයෙත්, රත්නපුර දිස්ත්‍රික්කයෙත් පාසල් තෝරාගෙන සංවර්ධනය කරන්න විශාල මුදලක් වෙන් කරලා තියනවා. අද අපට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් තියනවා මේ පාසල්වලට වෙන් කරපු මුදල කොයි ආකාරයෙන් යොමු කරලා තියනවාද කියන එක දැන ගන්න අවශ්‍යතාවයක් තියනවා. එහෙම නම් අපි ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කෙසේද ? එය දිස්ත්‍රික්ක මට්ටමින්, කලාප මට්ටමින්, කොට්ඨාශ මට්ටමින් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. ඉහත ව්‍යාපෘතිය යටතේ එක් එක් පාසල් සඳහා වෙන්කර ඇති මුදල කොපමණද ?, ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කෙසේද ? ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ භෞතික සම්පත්

පමණද වැඩි දියුණු කරන්නේ කියන එකත් අපට අහන්න වෙලා තියනවා. මානව සම්පත් වැඩි දියුණු කරන්නේද ? ඒ සඳහා ගන්නා ක්‍රියා මාර්ග කවරේද කියන එකත් අපි අහනවා. මේ ප්‍රශ්නවලට ඉතා ඉක්මණින් ලිඛිතව පිළිතුරු ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මම මේ ලිපි සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු විපක්ෂනායකතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒ යෝජනා ප්‍රශ්න සියල්ලම ගරු අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යොමු කිරීමට කටයුතු කරනවා. මීළඟට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ කාරණා දෙකයි. විනාඩි දෙකයි මම තමුන්නාන්සේගෙන් ඉල්ලන්නේ. එකක් තමයි ගරු සභාපතිතුමනි, අපේ මේ සබරගමුව පළාත් සභාවේ පෙත්සම් කාරක සභාව. මේ ගැන මාත් සමඟ ගරු මැති ඇමතිවරු තරහා වෙන්න එපා. මේ පෙත්සම් කාරක සභාවේ නම ඉස්සෙල්ලා වංචා විමර්ශණ කමිටුව. මෙක ඇති කළේ 1993 මම පළාත් සභාවට ඇවිල්ලා මාස දෙකෙන්. අපේ අසෝක ජයවර්ධන මැතිතුමා මේකට සාක්ෂි දරයි. කච්චේරියේ පළාත් සභාව තිබුනේ. මේස උඩ නැග්ගා. පුටු උඩ නැග්ගා. මේස පොළවේ ගැහුවා. විවිධ දේවල් කියලා මේ සබරගමුව පළාත් සභාව හොර වංචා ගුහාවක් කියලා මේකට වංචා විමර්ශණ කමිටුවක් ඕන කියලා අවුරුද්දයි මාස අටක් ගිහින් තමයි සභාපතිතුමනි, මේක ක්‍රියාත්මක කරගන්න පුළුවන් වුනේ. ඒක ක්‍රියාත්මක කරනකොට එදා පළවෙනිම දවසේ නිර්නාමික ලිපියක් ආවා එරත්නේ මුරුත්තෙට්ටු කන්දේ 1,365,000 ක් වියදම් කරලා හදපු ගොඩනැගිල්ලේ ප්‍රමිතියට නෑ කියලා. එවකට හිටපු සභාපතිතුමා කිව්වා නිර්නාමික ලිපියක් නිසා වැඩක් නෑ කියලා. මම කිව්වා නිර්නාමික ලිපිය තමයි වැදගත් වෙන්නේ. මේ තොරතුරු හරියාකාරව දෙන්න බැරි නිසා තමයි නිර්නාමිකව එවලා තියෙන්නේ. එහෙම නම් වංචා විමර්ශණ කමිටුව මේක බලන්න ඕනෑ කිව්වාම කවුරුවත් ආවේ නෑ. මම තනියම ගියා. නව දෙනෙක් ඉන්නවා කමිටුවේ. කිසි කෙනෙක් ආවේ නෑ. මම තනියම ගියේ. තිනයම ගිහිල්ලා ඉවර වෙලා අර කියාපු ආකාරයට බිත්තියට තට්ටුවක් දානකොට බොල් සද්දෙ එනවා. පයින් පාරක් ගැහුවාම කඩාගෙන වැටුනා ගරු සභාපතිතුමනි, එක බිත්තියක්. මේකේ මැට්ටෙන් හදලා ඉවර වෙලා වටේට සිමෙන්තියෙන් කපරාරු කරලා. එදා පළමුවෙන්ම පෙත්සම් කාරක සභාවෙන් 1,365,000 ම ගෙව්වේ නෑ, කොන්ත්‍රාත්කරුවාට. මේ විදිහට ලක්ෂවලින් කියනවා නම් දහ පහළොස්දාහක් මේ පෙත්සම් කාරක සභාව, අද පෙත්සම් කාරක සභාව නම. මේ හරහා ඉතිරි කරලා තියනවා රජයේ මුදල්. වංචාවෙන් ගසාගෙන කන මුදල්. මේ උත්තරීතර සභාව හා සමානයි පෙත්සම් කාරක සභාව. මේ සභාවේ ඉන්න නවදෙනා හොඳ අවධානයෙන් ඉන්න. මේ අයට පෙත්සම් කාරක සභාවට පැමිණෙන්න බැරි නම් කරුණාකරලා ඉල්ලා අස්වෙන්න කියලා මම කියනවා ගරු සභාපතිතුමනි, වගකීමෙන්. මේක උත්තරීතර ආයතනයක් පළාත් සභාව හා සමාන. පෙළක් මන්ත්‍රීවරු, ඇමතිවරු පෙත්සම් කාරක සභාවට ලියුම්

එවනවා තොරතුරු එවනවා. එදාට කථා කරන්න එන්නේ නෑ. මම මේක සභාවේ කථා කරන්න වීම ගැන කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි. මොකද අපි ගිහිල්ලා අපි දෙන්නා විතරක් තනි වෙනවා. අපි හැමදාම දෙන්නයි ඉන්නේ. පස්සේ තමයි තුන්දෙනෙක් හතර දෙනෙක් වෙන්නේ. නව දෙනෙක් ඉන්නවා නම් නවදෙනාම සහභාගී වුන එක දවසක් කියන්න මට. ඒ අයට බැරි නම් අපට වෙන කවුරු හරි දාගන්න බැරි අය ඉල්ලා අස්වෙන්න. අපට පුළුවන් සභාපතිතුමාත් එක්ක මේක ගෙනියන්න ගරු සභාපතිතුමනි.

ඒ වගේම තවත් කාරණයක් කණගාටුදායක මාසයකට දෙවරයි විසි දෙලක්ෂයක් ජනතාවගේ ප්‍රශ්න කථා කරන්න තියෙන්නේ මේ ගරු සභාව සභාපතිතුමනි. එකේ පළවෙනි දිනය ගත්තාම අද වගේ දිනයක ගරු සභාපතිතුමනි, ගනපූරණය නෑ කියනවා වැදගත් යෝජනාවක් ආවාම කථා කරන්න, ඇනහිටිනවා. නමුත් ඊඟාව දිනයේ හතලිස් හතරදෙනාම බහුතරයක් ඉන්නවා, එදාට පඩි. මම කියනවා ගරු සභාපතිතුමනි, මේ සභාව තමුන්නාන්සේ සභාපතිවරයා වුනත් වැරැද්දක් තියනකොට ඒ වැරැද්ද පෙන්වන්න ඕන. කියන්න ඕන. ඒ නිසා මින් ඉදිරියටවත් මේ ගනපූරණය පක්ෂ විපක්ෂ කාටත් අයිති දෙයක්. ජනතාවගේ ප්‍රශ්න කථා කරනවා නම් ඒක ආණ්ඩු පක්ෂයට අයිති දෙයක් කියලා නිකම් ඉන්න බෑ. ඒක විපක්ෂයෙන් ගෙනාපු යෝජනාවක් නිසා අපි යනවා කියලා කියන්න බෑ. ජනතාවගේ ප්‍රශ්න කථා කරනකොට මේ 44 දෙනාගෙන් බහුතරයක් ඉන්න ඕන කියන එක ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමනි, අවස්ථාව දීම සම්බන්ධයෙන් තමුන්නාන්සේට ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

*Hon.Chairman Kanchana Jayarathna*

------------------------------------------------------------

ස්තුතියි ! ගරු විපක්ෂයේ සංවිධායකතුමනි. ඔබතුමා විසින් ඉතාම වැදගත් වූ මේ උත්තරීතර සභාව පවත්වාගෙන යාම සඳහා මහජනතාව විසින් පත් කරලා එවන ලද මහජන නියෝජිතයින් සියළුදෙනාටම ඉතාම වැදගත් වූ තම තමන්ගේ වගකීම් පිළිබඳව මතක් කර දෙමින්, මේ උත්තරීතර සභාවේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහා එතුමා විසින් ගෙන එන ලද යෝජනා දෙක පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය මම මේ අවස්ථාවේ දී පුද කරනවා. විශේෂයෙන් පෙත්සම් කාරක සභාවේ සභාපතිවරයා හැටියට එතුමා ප්‍රකාශ කළා වගේ අපි පහුගිය කාල සීමාව තුළ ඉතාම වෙහෙස මහන්සි වෙලා මේ ජනතාව විසින් ඉදිරිපත් කරන ලද විශාල පෙත්සම් ගණනාවකට අපට සහන ලබාදෙන්න කමිටුවක් හැටියට කටයුතු කරන්න පුළුවන්කම ලැබුණා. සමහර අවස්ථාවල දී ඒ පැමිණෙන රජයේ නිළධාරීතුමන්ලා ඒ වගේම පැමිණිලිකාර පාර්ශවයන් සහ අනෙකුත් අය විමසීම් කරනවා මේ කාරක සභාවේ ඉන්නේ මෙච්චරද කියලා. ඉතින් ඒක නිසා, මොකද අපි ලියුමක් යවනවා පැමිණිලිකරුවන්ට සහ ඒ සහය දක්වන පිරිස්වලට පැමිණෙන්න කියලා. ඒකේ පෙත්සම් කාරක සභාවේ ඉන්න සාමාජිකයන්ගේ නම් දාලා තමයි අපි යවන්නේ. හැබැයි කමිටුව රැස්වෙන වෙලාවට, බොහෝ වෙලාවට කමිටුවේ ගනපූරණය තියාගන්නෙත් බොහොම අමාරුවෙන්. ඉතින් ඒ නිසා ඒක පක්ෂ විපක්ෂ ගරු මැති ඇමතිතුමන්ලා වගකීමකින් ඒ කාරක සභාවල් නියෝජනය කරන සියළුදෙනාම වගකීම් හැටියට ඒවා භාර අරගෙන කටයුතු කරන්න කියලා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***

ඒ වගේම අනෙක් කාරණය තමයි ගනපූරණය පිළිබඳ කාරණාව. එතුමා පැහැදිලි කරන්න යෙදුනා. ගනපූරණයේ කාරණාව පිළිබඳවත් ආණ්ඩු පක්ෂයට වගේම විපක්ෂයටත් මේ කාරණාවට වගකීමක් තියනවා. ඒ නිසා තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕන මාසයටම දවස් දෙකයි තියෙන්නේ. ඒ දවස් දෙකේ දී සභාවේ කටයුතු සඳහා සහභාගී වෙච්චාම ඒ සඳහා සහභාගී වෙලා ජවනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් සභාවේ රීති අනුව සභාව පවත්වාගෙන යාම සඳහා ඉඩකඩ ලබාදෙන්න කියලා. දැන් සිරිල් පල්ලෙපොල මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නය මතු කරපුවාම මට සිද්ධ වෙනවා සභාපතිවරයා හැටියට සීනුව නාද කරන්න. ඒත් වුනේ නැත්නම් මට සභාව කල් තැබීමට පවා සිද්ධ වෙනවා. ඒ නිසා මම හිතන්නේ එහෙම තැනකට අපි යායුතු නෑ. වෙම් සභාව ඉතාම වැදගත් ආකාරයට මෙච්චර කාලයක් අපි පවත්වාගෙන ආවා. ඒ නිසා ඒ වගකීම, වගකීමක් විදිහට අපි සියළුදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

මීළඟට ගරු සිරිල් පල්ලෙපොල මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව.

***ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල***
***கௌரவ சிரில் பல்லேபொல***
*Hon.Member Cyril Pallepola*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුනි. මම අවස්ථාවක් කරගන්නේ 5 ශිෂ්‍යත්වයේ ලකුණු රාශියක් අරගෙන ලංකාවේ පළවෙනියා වුන ඒ දරුවා වෙනුවෙනුත් මම නියෝජනය කරන කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම ආසනයේ කෑගලු දිස්ත්‍රික්කයෙන් පළවෙනි ස්ථානය ලබපු දැදිගම කණිෂ්ඨ විද්‍යාලයේ ඒ දරුවා වෙනුවෙන්. ගරු සභාපතිතුමනි, අපි අද සබරගමුව පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන් හැටියට අපි ගොඩාක් සතුටු වෙන්න ඕන අද ලංකාවෙන්ම පළවෙනි ස්ථානය අරගෙන තියෙන්නේ ගරු සභාපතිතුමනි, ලකුණු 196 ක් ලබලා ලංකාවේ පළවෙනි ස්ථානය ගත්තු දරුවා දික්වැල්ල, ඌරුගස්මුල්ල ඒ විද්‍යාලයේ නිරංජ සමරවික්‍රම සිසුවාටත් මම මේ අවස්ථාවේ සුභ පතනවා. ඒ වගේම දරුවන් දොළොස් දෙනෙක් ශිෂ්‍යත්ව විභාගයෙන් ජයග්‍රහණය කරලා, අද දියණියන් හය දෙනෙක් සහ පුතනුවන් හය දෙනෙක් ඉන්නවා. අපි ඒ සියළුදෙනාටම අපේ සබරගමුව පළාත් සභාවේ සුභ පතන ගමන් මම විශේෂයෙන්ම මම නියෝජනය කරන දැදිගම ආසනයේ දැදිගම කණිෂ්ඨ විද්‍යාලයේ ලකුණු 194 ක් ලබමින් ලංකාවේ තුන්වැනි ස්ථානයත්, කෑගලු දිස්ත්‍රික්කයේ පළවෙනි ස්ථානයත් හිමිකර ගත්තු නදීෂා නන්දසේන රාජපක්ෂ දියණියට පළමුවෙන්ම මම සබරගමුව පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මම ඒ දියණියට සුභ පතනවා. ඒ වගේම ඒ දරුවාගේ මවට පියාට ඒ වගේ දරුවෙක් බිහි කරලා සබරගමුවට, කෑගලු දිස්ත්‍රික්කයට, දැදිගම ආසනයට ගරු නම්බුනාමයක් දීලා එසේ කිරීම පිළිබඳව මගේත් සබරගමුව පළාත් සභාවේ සියළු දෙනාගේම ගෞරවය අපි හිමිකරන්න ඕන. ගරු සභාපතිතුමනි, මේ දරුවා ඒ විතරක් නෙමෙයි ඒ දියණිය 2013 වසරේ චෙස් ක්‍රීඩාවෙන් රටවල් 19 ක් අතර පැවති අවුරුදු 15 න් පහළ ආසියානු තරඟවලට සහභාගී වී ආසියාවේ තුන්වැනි ස්ථානය හිමිකර ගත්තු මේ දියණිය ලෝකයේ චෙස් ක්‍රීඩා සංගමයේ කැන්ඩියන් චෙස් මාස්ටර් යන නාමාවලිය ලබලා තියනවා ගරු සභාපතිතුමනි. අපි සතුටු වෙන්න ඕන. හැබැයි ගරු සභාපතිතුමනි, මම කණගාටු වෙනවා අපේ ගරු සිරිපාල මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ විෂයය කථා කරනකොට අධ්‍යාපන ඇමතිතුමා නෑ. මම මහජන නියෝජිතයෙක්

හැටියට සබරගමුව පළාත් සභාව නියෝජනය කරන්නේ. කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම ඓතිහාසික ආසනයක්. මමත් තවත් පළාත් සභා මන්ත්‍රීවරු කීප දෙනෙක් ඉන්නවා. මේ පාසල්වල තියන අඩුපාඩු පිළිබඳව අපේ විපක්ෂනායකතුමා කිව්වා. මම හොඳකාරවම දන්නවා. ඇත්තටම අපි කථා කරනවා නම් ගරු සභාපතිතුමනි, කෑගලු දිස්ත්‍රික්කයේ දැදිගම ආසනයේ එදා සබරගමුවේ අධ්‍යාපන ඇමති කවුද කියන එක දන්නේ නෑ. මම ඒක හොඳාකාරව කියන්න ඕන. ඒ නිසා මම නියෝජනය කරන පාසලක් තියනවා ගලපිටමඩ පාසල. ඒ පාසල ගැන කිව්වත් මේ සියළු සිද්ධීන් වෙන්නේ. විශේෂයෙන් මේ දරුවෝ මේ සබරගමුවට ගෙන්නලා, පළාත් සභාවට ගෙන්නලා, මේ දරුවන්ට ඇගයීමක් කරලා, දෙමව්පියන්ට සුභ පතලා, තෑග්ගක් දීලා මේ දරුවා තවත් දිරිමත් කරන්නට කියන යෝජනාව මම මේ සබරගමුව පළාත් සභාවට දෙනවා. මේ පත්තරේ තියනවා පාසලේ දෙන වැඩ ටික හරියට කලාලු. ටියුෂන් ගියේ නැහැලු මේ දරුවා. එතකොට අපේ පරාක්‍රම මන්ත්‍රීතුමා කිව්වා දැන් අපි මේ දරුවා ජයග්‍රහණය කළාම ඇපල් ෆෝන් එකක් දෙනවා. තවම දෙන්න හොඳ නෑ. මේ දරුවන්ට දෙන්න වෙන්නේ 10 විභාගය වගේ ලිව්වාට පස්සේ තමයි ඒ ටච් ෆෝන් එක දෙන්න වෙන්නේ. දරුවෝ නොමග අරින්නේ දෙමව්පියෝ සහ ගුරුවරු. මගේ දරුවා වුනත් හදාගන්න එකේ වගකීම මට තියනවා. දරුවා පාසලට යනකොට අන්දවලා, සපත්තු දෙක දමලා,

යුනිෆෝම් එක අන්දවලා හරියට අරින එක හරි. ගෙදර ගිහිල්ලා ආපහු බලන්න ඕන පාසලේ කරපු වැඩ සටහන මොකක්ද කියලා. අපි සතුටු වෙන්න ඕන මහජන නියෝජිතයෝ හැටියට. මේ පත්තරේ ගත්තාම දොළොස් දෙනාගෙන් හය දෙනෙක් කාන්තා දරුවෝ. හය දෙනෙක් ගැහැණු දරුවෝ. හය දෙනෙක් පිරිමි දරුවෝ. හැබැයි එක්කෙනෙක්වත් කොළඹ පාසල් වලින් 5 ශිෂ්‍යත්වය ලබලා නෑ.

එක දරුවෙක් ඉන්නවා යාපනේ. එක දරුවෙක් ත්‍රිකුණාමලේ. අනෙක් දරුවා වවුනියාවේ. අපි සතුටු වෙන්න ඕන. අපේ රටේ මේ භේදය ඇති වුනෙත්, ප්‍රශ්නය ඇති වුනෙත්, යුද්ධය ඇති වුනෙත්. මේ ද්‍රවිඩ දරුවෝ අද 5 ශිෂ්‍යත්වයෙන් ඉස්සරහාට ගිහිල්ලා තියනවා. අපි ඒ ගැන කල්පනා කරලා බලන්න ඕන. ප්‍රශ්න ඇති වෙන්නේ නෑ. අද දූප්පත් පොහොසත් කියලා නෙමෙයි කොළඹ යන දරුවා ඒ.සී. වාහනේ කොළඹ යනවා. ගිහිල්ලා බස්සවනවා. අම්මා දොරකඩ බලාගෙන ඉන්නවා දරුවා එළියට එනකල්. එහෙම දරුවෝ නෙමෙයි මම හිතන්නේ මේ දරුවෝ. ගඩොල් කපලා, වැලි ගොඩදාලා, දූක් විඳලා මේ දරුවෝ පාසල් අරන්න ඇත්තේ.

ඒ නිසා අපි සතුටු වෙන්න ඕන. මේ දරුවා විතරක් නෙමෙයි දැදිගම ආසනය ගැන කියනකොට 2015 මේ දරුවා මෙහෙම තත්ත්වයට පත් වෙනකොට 2016 වැඩිම ලකුණු ගත්තේ මාකුර විද්‍යාලයේ දැදිගම ආසනයේ ලකුණු 196 ලබමින් කණිෂ්ක වනිගසේකරගේ දරුවා යාන්තම් කියලා කියලා අර වහලේ උළුකැට ටිකයි, මුක්කුවයි ගැලෙව්වා. ඒ පාසල දිහා ආපහු බැලුවේ නෑ. ඒ ගැන මම කණගාටු වෙනවා ගරු සභාපතිතුමනි. ඒ පාසලට අල්ලපු ඉඩම ගන්න කියලා ලියුම් ගැහුවා, ගැහුවා. අද වෙනකල් ඒ ඉඩම ගන්න කථා කළේ නෑ.

එහෙම නම් මේ දරුවෝ ගැන අපි කථා කරන්නේ අවුරුද්දෙන් අවුරුද්ද විතරයි. ඒ නිසා මේවා නිවැරදි කරන්න ඕන අධ්‍යාපනය හැටියට. අපේ නව රජය මම දන්නවා හොඳාකාරවම විශාල මුදලක් අධ්‍යාපනයට පළාත් සභාවට වෙන් කරලා තියනවා. මිලියන ගාණක්. ඒ මුදල්වලින් අවශ්‍ය පාසල්වලට අවශ්‍ය දේවල් කරන්න ඕන. මම පාසල් ගිය පාසල වලගම්බා විද්‍යාලය. ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීතුමා නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමා. පරාක්‍රම අතාවුද මන්ත්‍රීතුමා. අද ඒ පාසලේ ග්‍රවුන්ඩ් එකේ ගල් ටික අයින් කරගන්න බැරි

වුනා 2007 ඉදලා. ඒ වගේම පළාත් සභාවේ මුදල් වෙන් කරලා අර වොලිබෝල් ක්‍රීඩාපිටිය හදලා තියනවා, අද මදුවැල් ගිහිල්ලා. මම කණගාටු වෙනවා පාසලේ ඉදලා පිට්ටනියට යන්න පාරක් නෑ. පයින් යන්නේ උඩ පැන පැන. මාර්ග සංවර්ධන අධිකාරිය දැන් බැම්ම කපලා. ආරක්ෂිත වැට බැම්ම නෑ. ඔබතුමාටත් වගකීමක් තියනවා. මටත් වගකීමක් තියනවා. මහජන නියෝජිතයෝ හැටියට මේකට දැදිගම ආසනයේ ජනතාවත්, රුවන්වැල්ලෙ ජනතාවත් එන තැනක්. මේවා ගැන අපි විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕන. අපි එදා පාසල් ගිය නිසා තමයි අද සබරගමුව පළාත් සභාව නියෝජනය කරන්නේ, අපේ දෙමව්පියන්ට, ගුරුවරුන්ට පිං සිද්ධ වෙන්නට. ඒ කටයුත්ත වෙන්නේ නෑ ගරු සභාපතිතුමනි. මේවා නිවැරදි වෙන්න ඕන.

මෙතන ගත්තත් අද ගනපූරණය ගැන කථා කරන්න වුනේ ඒක නිසා තමයි. මොකද අපි මන්ත්‍රීවරු 44 ක් ඉන්නවා. අපි විපක්ෂයේ නම් 14 දෙනයි ඉන්නේ. හැබැයි ආණ්ඩු පැත්තේ තමයි වගකීම. පළාත් සභාවේ බලය ඒ පැත්තේ. ලබන අවුරුද්දේ ඉදන් බලමු අපේ පැත්තට බලය ආවාට පස්සේ මීට වැඩිය ගමනක් යන්න තමුන්නාන්සේලා සියළුදෙනාටම ශක්තිය, ධෛර්ය, වාසනාව ලැබේවා ! කියලා

ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ! ගරු සිරිල් පල්ලෙපොල මන්ත්‍රීතුමනි. අර අන්තිමට කියපු ටික මම හිතන්නේ ඡන්දය තියන්න එපායැ ඉතින් නේද ? ඊළඟට ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා.

***ගරු මන්ත්‍රී නිහාල් ෆාරුක්***
***கௌரவ உறுப்பினர் நிஹால் பாறுக்***
*Hon.Member Nihal Farook*

---

ගරු සභාපතිතුමනි, මගේ පළවෙනි යෝජනාව ගරු විපක්ෂනායකතුමාත් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම බාබුල් හසන් මධ්‍ය මහා විද්‍යාලයේ ගුරු ප්‍රශ්නය සම්බන්ධයෙන්. ඇත්ත වශයෙන්ම කාලයක් තිස්සේ තිබෙන ගැටළුවක්, ප්‍රශ්නයක්. ඒ විද්‍යාලයේ මේ වනවිට ගුරුවරු 11 දෙනෙකුගේ අඩුපාඩුව තිබෙනවා. කෑගල්ල කලාපයේ ප්‍රධානතම දෙමළ මාධ්‍ය පාසල. ඒ වගේම මුස්ලිම්, ද්‍රවිඩ ළමයිනුත් විශාල වශයෙන් අධ්‍යාපනය ලබන පාසලක්.

ඉතින් අපි ඇත්තටම කණගාටු වෙනවා නොයෙකුත් අවස්ථාවල මේ පිළිබඳව අපි බලධාරීන් දැනුවත් කළත් අවශ්‍ය ගුරුවරු අපට ලබා ගැනීමට නොහැකිවීම පිළිබඳව අපි කණගාටුව මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා. ඒ වගේම

මෙතන මම හිතන්නේ පළාත් සභාව ගත්තාම මේ පිළිබඳව උත්තර දෙන්න මම හිතන්නේ ඇමතිවරු කවුරුවත් නෑ. ඉතින් ඒ පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. කෙසේ වෙතත් ඔබතුමා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා හැකි ඉක්මණින් මේ විද්‍යාලයට මේ අවශ්‍ය ගුරුවරු ටික ලබාදීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස ඉතාමත්ම කාරුණිකව ඉල්ලනවා. මොකද හෙට අනිද්දා වෙනකොට දෙමව්පියෝ, ගුරුවරු, ළමයි එක්ක පාරට බහින්න ඉඩ තියනවා. ඒකට ඉඩ නොදී ඉක්මණින්ම මේ කටයුත්ත කරදෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ වගේම දෙවෙනි යෝජනාව ලෙස මම ඉදිරිපත් කරලා තියනවා සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි දන්නවා පහුගිය දවස්වල වතු කම්කරුවන්ගේ දෛනික වැටුප සම්බන්ධයෙන් උද්ඝෝෂණයක් හැම තැනම තිබෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම මේ අහිංසක වතු කම්කරුවන්ගේ දවසක වැටුප, දෛනික වැටුප රු.1,000 දක්වා ලබාදෙන්න කියලා ඒගොල්ලෝ ඉල්ලනවා. ඇත්ත වශයෙන්ම අපි සියළුදෙනාම පිළිගන්නවා මේක ලබාදිය යුතුයි. ඒ නිසා වතු සමාගම් එක්ක වෘත්තීය සමිති ඒකාබද්ධ ගිවිසුමක් අත්සන් කරලා තියනවා. මේ ගිවිසුම නිසා තමයි අද මේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ.

ඒ නිසා මේ ඒකාබද්ධ ගිවිසුම වහාම අහෝසි කළයුතුයි. අහෝසි කරලා විශේෂයෙන්ම මේ වතු කම්කරුවන්ගේ දෛනික දීමනාව දවස් හයක් එක්ක වැඩ දීලා, දෛනික වැටුප රු.1,000 දක්වා ලබාදීම මම හිතන්නේ ඉතාමත්ම වැදගත් වෙනවා. මොකද අද තියන තත්ත්වය අනුව මේ වතු කම්කරුවන් මේ රටේ විදේශ විනිමයට විශාල ශක්තියක් ලබාදෙනවා. ඒ නිසා මේ වතු කම්කරුවන්ට අද වෙලා තියන අසාධාරණය අද රජයේ සේවකයින්ගේ

වැටුප් වැඩි කළා. පුද්ගලික අංශයේ වැටුප් වැඩි වුනා. ඒ වගේම විශ්‍රාමිකයන්ගේ වැටුප වැඩි වුනා. නමුත් මේ අහිංසක අසරණ කම්කරුවන්ගේ දීමනාව වැඩි වුනේ නෑ. ඉතින් මේ පිළිබඳ අවධානය යොමු කරලා අපේ පළාත් සභාව මම හිතන්නේ සියළුදෙනාම එකඟ වෙයි. ඒ නිසා මේ පිළිබඳව අවධානය යොමු කරලා වතු සමාගම්, ඒ වගේම රජය මේ පිළිබඳව දැනුවත් කරලා ඒ අවශ්‍ය කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ඉතාමත්ම කාරුණිකව ඉල්ලනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු නිහාල් ෆාරුක් මන්ත්‍රීතුමාට. විශේෂයෙන්ම එතුමා, විපක්ෂනායකතුමා ඒ වගේම සිරිල් පල්ලෙපොල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ සියළු යෝජනා ගරු අධ්‍යාපන ඇමතිවරයාටත්, ඒ වගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් අපි යවමින් විශේෂයෙන්ම එම ජයග්‍රහණය ලබාගන්නා ලද විදුහල නියෝජනය කරමින් ඒ දරුවා වෙනුවෙන් සමස්ත පළාත් සභාවේ සුභ පැතුම්, සුභාශිංසන, ස්තුතිය පිරිනමමින් විශේෂයෙන්ම ඒ පාසලේ සහ අනෙකුත් පාසල් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා වෙනුවෙන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යවරයාටත්, ලේකම්වරයාටත් යොමු කිරීමට කටයුතු කරන බව මේ අවස්ථාවේ දී දැනුම් දෙනවා. මීළඟට ගරු අනුර අලගියවන්න මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී අනුර අලගියවන්න***
***கௌரவ உறுப்பினர் அனுர அலகியவன்ன***
*Hon.Member Anura Alagiyawanna*

----------------------------------------

ගරු සභාපතිතුමනි, මම විනාඩියක වගේ කෙටි කාලයක් ගන්නේ. අද උදෑසන මම විශ්වාස කරනවා ගරු විපක්ෂනායකතුමා ඔබතුමාත් විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාත්, මගේ මිත්‍ර අජිත් කුමාර මන්ත්‍රීතුමාත් මේ පුංචි තත්පර 60 ක වගේ කාල සීමාව ඔබ ඔබේ අසුනේ

ඉදියි කියලා විශ්වාස කරනවා. මොකද මේ ගනපූරණය සම්බන්ධයෙන් බරපතල ප්‍රශ්නයක් තියනවා. අපි මාසයකට දවස් දෙකයි මේ ගරු සභාව නියෝජනය කරන්නේ. ගර සභාවේ දී අපට ප්‍රශ්නයක් තියනවා නම් කියන්න තියන එකම තැන මෙතන. සමහර නිළධාරින් ඉස්සරහාට ගිහිල්ලා අපි කිව්වාම බීරි අලින්ට වීණා වයනවා වගේ. ඒ නිසයි මම මෙතන කියන්නේ. නැත්නම් මට මෙතන කියන්න අවශ්‍යා වෙන්නේ නෑ. මම අද උදේ ඕපාත අංක 01 දෙමළ විද්‍යාලයට ගියා. ඔබතුමාටත් අජිත් කුමාර මන්ත්‍රීතුමා අයිතියි, මටත් අයිතියි. මම ගියේ උත්සවයේ ආරාධිතයා හැටියට. උදේ 8.30 ට තියන දේව පූජාවට සම්බන්ධ වෙන්න. හැබැයි ඒක පටන් ගන්න කලින්, ගරු සභාව ආරම්භ වීමට පෙර මට සම්බන්ධ වෙන්න් ඕන නිසා මම කියලා ආවා. නමුත් විදුහල්පතිතුමාගේ ඉල්ලීමක් තිබුණා 80 x 20 ගොඩනැගිල්ලක් ඉදිවෙමින් පවතිනවා. මට කිව්වා ගරු මන්ත්‍රීතුමා කාල වේලාව ගියත් කමක් නෑ ගොඩනැගිල්ල නිරීක්ෂණය කරලා එන්න කියලා. පන්ති කාමර 4 ක තමයි මට මතක හැටියට 80 x 20 ගොඩනැගිල්ල පන්ති කාමර වෙන් කරලා තියන හැම බිත්තියක්ම සට සට ගාලා හෙලවෙනවා. ගිහිල්ලා බලන්න. මම ඔක්කෝටම ආරාධනා කරනවා. මම මාධ්‍යයට ආරාධනාවක් කරනවා. ගිහිල්ලා බලන්න කියලා. හැබැයි විදුහල්පතිතුමා ඒ දොරවල් ටික ලොක් කරලා ඩෙස්ක් තියලා අද තියෙන්නේ. බැරි වෙලාවත් ගිහිල්ලා ළමයෙක් දෙන්නෙක් බිත්තියට හේත්තු වුනොත් බිත්තිය කඩාගෙන වැටෙනවා. මුදුන් බිත්ති දෙක විතරයි උඩට හිරවෙලා තියන නිසා තියෙන්නේ. හතර වටේ බිත්ති ඔක්කෝම කණුත් එක්ක සම්බන්ධ නෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අද මේ දැන් පුළුවන් නම් ක්‍රියා මාර්ගයක් අරගෙන විධායක ඉංජිනේරු ගොඩනැගිලි දැනුවත් කරලා අදම යවන්න මේ කාරණය පිළිබඳව. නැත්නම් අනිවාර්යයෙන්ම දරුවෝ දන්නේ නෑ. මේකේ ජාති භේදයක් නෑ. ඒ නොදරුවෝ ගිහිල්ලා බිත්තියට හේත්තු වුනොත් අනිවාර්යයෙන්ම බිත්තිය කඩාගෙන වැටෙනවා. කඩාගෙන වැටුනොත් බොහොම ඛේදජනක සිද්ධියකට මුහුණ දෙන්න වෙන්නේ. සබරගමුව පළාත් සභාවටම අපකීර්තියක් සිද්ධ වෙනවා. ඒ නිසා කරුණාකරලා හැකිතාක් ඉක්මණට යෝජනා එනවා. යෝජනා කථා කරනවා. විද්වත් මණ්ඩලවලට යනවා. රූපවාහිනියට යනවා. අනෙකුත් චැනල්වලට යනවා. ගිහිල්ලා කථා කරනවා. කිසිඳු පළ ප්‍රයෝජනයක් නෑ. අපි අඳුරට ශාප කරන්නේ නැතුව එක පහනක් හරි පත්තු කරන්න ඕන වෙලාව. ඒ නිසා වහාම ක්‍රියාත්මක වෙන්න. ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න. ඕපාත අංක 01 දෙමළ විද්‍යාලය. ස්ප්‍රිංහුඩ් එකත් එහෙමලු. මම හෙට ගිහින් ඒකත් බලනවා. ඒ වගේ කරන ව්‍යාපෘති 4 ක්, 5 ක් තියනවා. ඔක්කෝම ටික බලනවා හෙට වෙනකොට. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේකට අදම, වහාම ක්‍රියා මාර්ගයක් ගන්න කියලා ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

ස්තුතියි ! ගරු අනුර අලගියවන්න මන්ත්‍රීතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද වැදගත් වූ යෝජනා සම්බන්ධයෙන් විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා සමස්ත මේ පළාත් සභාවටම ලොකු අපකීර්තියකට පත් වෙන්න සිද්ධ වෙන කාරණා තමයි එවැනි සිද්ධියක් වෙලා තියනවා නම්. ඒ පිළිබඳව අපි වහාම ක්‍රියාත්මක වෙලා යම් වරදක් සිද්ධ වෙලා තියනවා නම් ඒ පිළිබඳව නීත්‍යානුකූලව අවශ්‍ය ගෙවීම් අත්හිටුවමින්

ඒ වගේම වැරදි ආකාරයට එවැනි කටයුතු කරලා තියනවා නම් ඒ පිළිබඳව විධිමත්ව ඒ පිළිබඳව ක්‍රියා මාර්ග ගැනීම සඳහා අවශ්‍ය නිළධාරීන්ට දැනුම් දීලා ඒ පිළිබඳව කටයුතු කරන්න මෙහෙයවන බව මේ අවස්ථාවේ දී දැනුම් දෙනවා.

මීළඟට ගරු බාස්කරන් මන්ත්‍රීතුමාගේ අවස්ථාව.

***ගරු මන්ත්‍රී අන්නාමලයි බාස්ගරන්***
***கௌரவ அண்ணாமலை பாஸ்கரன்***
*Hon Member Annamalei Basgaran*

---

ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ මන්ත්‍රීවරුනි. මේ අවස්ථාවේ දී ගරු සභාපතිතුමනි, මම කියන්න හදන්නේ අපි දන්නවා රුපියල් 10,000 ක පඩියක් පැය 24 න් වැඩි කළා. ගරු අගමැතිතුමායි, ගරු ජනාධිපතිතුමයි එක්කහු වෙලා රු.10,000 ක් දවසින් පඩි වැඩි කළා. ඒ කියන්නේ ආණ්ඩුවේ සේවය කරන අයට. ඉන්පස්සේ

ප්‍රයිවට් ආයතනවලට රු.2500 ක් වැඩි කළා. මම අහන්න කැමතියි ප්‍රයිවට් ආයතන කිව්වට පස්සේ කැළණිවැලි ප්ලාන්ටේෂන් එක නැත්නම් රිචඩ් පීරිස් එක මේවාත් ප්‍රයිවට් ආයතන තමයි. මම අහන්න කැමතියි මේ රටේ වතුකරයේ ද්‍රවිඩ ජනතාව මීට ඉස්සෙල්ලත් මේ සභාවේ මම අහලා තියෙන්නේ අපිව පාවිච්චි කරන්නේ ඡන්දෙට විතරයි. මේ රටේ පුරවැසිභාවය අපට තියනවා නම්, අපව ඡන්දෙට විතර ද පාවිච්චි කරන්නේ ? මොකද මේ රටේ සියළුම ආයතනවලට, ප්‍රයිවට් ආයතනවලට නැත්නම් ආණ්ඩුවේ ආයතනවලට රු.10,000 ක් වැඩි කරලා තියනවා. ප්‍රයිවට් ඒවාට 2500 ක් වැඩි කරලා තියනවා. අපට ඒ 2500 වැඩි කරලා නෑ. මම අහන්න කැමතියි දැන් අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා

දෙන්න ඕන කියලා. මේ රටේ සියළුම පුරවැසිභාවය තියන අයට දෙනවා නම් අපට ඇයි දෙන්න බැරි 2500 ක්. අපට කියන්නේ මොකක්ද පාර්ලිමේන්තුවෙන් ? පාර්ලිමේන්තුවෙන් පනතක් ගේනකොට මේගොල්ලෝ කියනවා ඇග්‍රිමන්ට් එක තියන හින්දා අපට මේ වැඩි කිරීම කරන්න බෑ කියලා. නමුත් මම කියන්නේ පාර්ලිමේන්තුවේ ගේනකොට ඡන්දයට අපිව පාවිච්චි කරනවා නම් අනෙක් පුරවැසියන්ට තියන අයිතිවාසිකම අපට තියනවා නම් අපටත් ඒ ප්‍රයිවට් ආයතනවලට දීපු 2500 දෙන්න තිබුණා. ඒක දීලා නෑ. මොකද දීපාවලී අවස්ථාවේ දී ඊයේ රෑ 12.00 වෙනකල් පඩි දීලා නෑ. අපේ ජනතාව හුඟාක් අසරණ තත්ත්වයට පත්වෙලා තියනවා.

ඒත් එක්කම ගරු සභාපතිතුමනි, අපේ පූනගල වත්තේ යටියන්තොට ආසනයේ පූනගල වත්තේ සෙම්බතසිරියල් පූංගා කියලා පොඩි ළමයින්ගේ පෙර පාසල. නමුත් තව එක්ක තියනවා අපි කියන්නේ ළමා ආරක්ෂක තැන. ඒ කියන්නේ පෙර පාසලයි, ළමා ආරක්ෂක තැනයි ගරු සභාපතිතුමනි, දෙකක්. දැන් පූනගල

වත්තේ සෙන්බතසිරියල් පූංගා කියලා එක්ක තිබුණා. ඒක ට්‍රස්ට් එක යටතේ අපි ලස්සනට කරගෙන ගියා. දැන් ඒක වහලා දාලා තියනවා. වහලා දාලා ළමා ආරක්ෂක තැනට ගිහිල්ලා දාලා තියනවා. ඒත් එක්කම මම සභාවට කියලා තියනවා පුන පුනා අපේ තැපැල් සම්බන්ධව හල්ගොල්ල වත්තේ උප තැපැල් කාර්යාලයක් තිබුණා ගරු සභාපතිතුමනි. දැන් ඒක වහලා දාලා තියනවා. කැන්දලව වත්තේ උප තැපැල් කාර්යාලයක් තියනවා. ඒකත් වහලා දාලා තියනවා. මම සභාවට කියලා තියනවා අපේ වතුවල ලියුම් ටික බෙදාගන්න අපේ පියුම් සබ්ජෙක්ට් එක, තැපැල් සබ්ජෙක්ට් එකට පත් කරන්න.

කරුණාකරලා මේ හල්ගොල්ල පූනාගල වත්තයි, කැන්දලව වත්තෙයි තියන දෙක හදලා දෙන්න. ට්‍රස්ට් එක යටතේ දී අපි ඉන්නකොට කරගෙන ගිය එක වහලා දාලා තියනවා. ඒකත් ඇරලා දෙන්න කියලා මේ අවස්ථාවේ දී ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මට අවස්ථාවක් දීපු එක ගැන ස්තුති කරලා මම නිහඬ වෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු බාස්කරන් මන්ත්‍රීතුමාට. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අදාළ බලධාරීන් වෙත යොමු කිරීම සඳහා කටයුතු කරනවා.

දැන් වෙලාව මධ්‍යාහ්න 12.18 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. මෙම ගරු සභාව 2016 ක් වූ ඔක්තෝබර් මස 25 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා.

අත්/කළේ :
කංචන ජයරත්න,
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පාලිත නානායක්කාර,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2016 ක් වූ ඔක්තෝබර් මස 31 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.